# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 ක් වූ වෙසක් අමාවක පෝදා 2023 මැයි 19 සිකුරාදා BUDUSARANA FRIDAY MAY 19, 2023

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 46 පත්‍රය , ආරම්භය 1965 - 06 - 13



ඔරුගොඩවත්ත ශ්‍රී සම්බුද්ධාලෝක විහාරය

ඡායාරූපය - ගයාන් පුෂ්පික

# සසුනඹර ඒකාලෝක කළ සුපින්බර සුපුන් සඳ

## අතිපූජ්‍ය දෙඩම්පහල චන්දසිරි මහා යතිවරයාණෝ



**ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක ධුරන්දර ව වැඩ විසූ අග්ගමහාපණ්ඩිත, අභිධජමහාරට්ඨගුරු අතිගෞරවාර්හ දෙඩම්පහල චන්දසිරි මහනායක මාහිමිපාණන් වහන්සේගේ අපවත් වීම පිළිබඳ අප සංඝ සභාවේ සංවේගය පළමු ව ප්‍රකාශ කර සිටිමු.**

හාරදහසකට අධික විහාරස්ථාන සහ දොළොස් දහසකට අධික මහා සංඝ රත්නයකින් සමන්විත වූ පාර්ශ්ව විසි දෙකකින් යුතු ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක පදවිය දෙවසරකට ආසන්න කාලයක් ශෝභමානවත් කොට වදාළ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අපවත් වන විට අසූ හතර වැනි වියෙහි පසු වූහ.

දකුණුලක මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල දොඩම්පහල ග්‍රාමයේ විසූ එදිරිවීර පටබැඳිගේ සරනේලිස් සිල්වා මැතිතුමාගේ සහ එදිරිසූරිය කට්ටඩි ආරච්චිලාගේ මිසිනෝනා මැතිනියගේ පුත් රුවනක ලෙස සුගුණදාස නමින් 1939 දෙසැම්බර් මස 20 වන දින මහ නාහිමිපාණන් වහන්සේ ජන්මලාභය ලැබූහ.

නිසි වයස් එළඹීමෙන් පසු දොඩම්පහල මහාවිද්‍යාලයෙන් අක්ෂරෝද්ග්‍රහණය කරමින් සිටින අතරතුර සාංසාරික පුණ්‍ය මහිමය ඉස්මතු වීමෙන් වර්ෂ 1950 නොවැම්බර් මස 25 වැනි දින තංගල්ල කුඩාවැල්ලේ වාළුකාරාමයේ දී මාතර ශ්‍රී සද්ධාරාම නාහිමියන්ගේ ආචාර්යත්වයෙන් ප්‍රව්‍රජ්‍යා සම්පත් ලැබීය. අතිපූජ්‍ය මහානාහිමිපාණන් වහන්සේ කතලුවේ ශ්‍රී ගුණරතනතිස්ස මහනාහිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරෙන් සමාරම්භ අමරපුර කල්‍යාණිවංශ මහානිකායේ නාඹටුන්නේ සඟ පරපුරට අයත් වෙති.

මාතර වීරබාහු පිරිවෙනින් හා ගාල්ල විද්‍යාලෝක පිරිවෙනින් ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණ කටයුතු සිදු කොට 1962 ජුනි මස 17 වැනි දින මාතර නූපේ ජයමහා විහාරාසන්න නිල්වලා නදී උදකුක්ඛේප සීමාවේ දී මාතර ශ්‍රී මේධානන්ද මහනාහිමියන් උපාධ්‍යාය කොට අධිශීල ශික්ෂා සංඛ්‍යාත උපසම්පදාව ලැබූහ.

උපසම්පදාවත් සමඟ ම කොළඹට වැඩම කළ මහනාහිමිපාණන් වහන්සේ ස්වකීය ජ්‍යෙෂ්ඨ පැවිදි සහෝදර කුඩාවැල්ලේ වංගීස මාහිමියන්ගේ ඇසුරෙහි වැඩ හිඳිමින් විපස්සනා භාවනා පුහුණුව ලදහ. 1962 සැප්තැම්බර් 09 වන දින තම පැවිදි සහෝදර වංගීස මාහිමියන්ගේ අනුශාසකත්වයෙන් හා මාතිකමාතා සංගමයේ මූලිකත්වයෙන් කලපලුවාවේ ගෝතම තපෝවනය ආරම්භ කළහ.

තමන් වහන්සේ මෙතෙක් සිදුකරගෙන ආ සම්බුද්ධ ශාසනික හා ජාතික සේවය තවත් පුළුල් ලෙස සිදු කිරීමට මෙය ඉමහත් අවකාශයක් විය. ආරම්භක අවස්ථාවේ පටන් අපවත් වන තෙක් ම එහි වැඩසිටිමින් ආයතනික උන්නතිය මෙන්ම ථෙරවාද බුදු දහමේ හරය ලොවට දායාද කිරීම පිණිස තම ජීවිතය කැප කළහ.

මිහින්තලේ කළුදියපොකුණ, පදවිය, කෑගල්ල, මහනුවර උඩවත්ත කැලේ ආදී තදීය තපෝවන ශාඛාවන්හි අනුශාසක හිමියන් ලෙස වැඩ සිටිමින් කම්මට්ඨානාචාර්යයන් වහන්සේ නමක වශයෙන් යෝගාවචරයන් දහස් ගණනකට භාවනා පුහුණුව ලබා දුන්හ. වර්ෂ 1982 දී කුඩාවැල්ලේ වංගීස හිමියන්ගේ හදිසි අපවත්වීමෙන් පසු කලපලුවාවේ ගෝතම

> **මහනුවර උඩවත්ත කැලේ ආදී තදීය තපෝවන ශාඛාවන්හි අනුශාසක හිමියන් ලෙස වැඩ සිටිමින් කම්මට්ඨානාචාර්යයන් වහන්සේ නමක වශයෙන් යෝගාවචරයන් දහස් ගණනකට භාවනා පුහුණුව ලබා දුන්හ. වර්ෂ 1982 දී කුඩාවැල්ලේ වංගීස හිමියන්ගේ හදිසි අපවත්වීමෙන් පසු කලපලුවාවේ ගෝතම තපෝවනය ඇතුළු තදීය ශාඛා මධ්‍යස්ථානයන්හි ප්‍රධාන අනුශාසකත්වයට පත් වූහ.**

තපෝවනය ඇතුළු තදීය ශාඛා මධ්‍යස්ථානයන්හි ප්‍රධාන අනුශාසකත්වයට පත් වූහ. එම අවස්ථාවේ දීම කල්‍යාණිවංශ මහානිකායේ කාරක සභික පදවියට සහ තපෝවන සංඝනායක පදවියට පත්ව අනුක්‍රමයෙන් අධිකරණ නායක, අනුනායක ආදී තනතුරුවලින් පුද ලදහ.

වර්ෂ 1986 දී තපෝවනය ආශ්‍රිතව ශ්‍රී වංගීස පිරිවෙන ආරම්භ කිරීමට ද චන්දසිරි මාහිමිපාණන් වහන්සේ මූලික වූහ. විසිවන සියවස මැද භාගයේ දී කල්‍යාණිවංශ මහානිකාය කොටස් තුනකට බෙදී මහා නාහිමිවරුන් තුන් නමක් යටතේ පාලනය සිදු වෙමින් වෙන වෙනම උපසම්පදා කටයුතු සිදු කෙරුණි. බෙදී තිබූ පාර්ශ්ව සියල්ල නැවත ඒකාබද්ධ කිරීමට නොපැකිළිව පෙරමුණ ගන්නා ලද්දේ දොඩම්පහල චන්දසිරි මාහිමිපාණන් වහන්සේ විසිනි.

පාර්ශ්ව තුනේම මහනාහිමිවරුන් ඇතුළු ප්‍රධාන හිමිවරුන් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට කැඳවා සම මහානායක හිමිවරුන් වශයෙන් පිළිගෙන එම මහානාහිමිවරුන් අපවත් වන විට නව මහානාහිමිවරුන් පත් නොකොට අවසානයට අපවත් වන මහානාහිමියන් අපවත් වූ පසු සමස්ත කල්‍යාණිවංශ නිකාය ම වෙනුවෙන් එක් මහානායක හිමිනමක පත් කර ගැනීමටත්, එම පාර්ශ්ව තුනේම හිමිවරුන් කැමැති කරවා ගැනීමට චන්දසිරි මහ නාහිමිපාණන් වහන්සේ සමත් වූහ.

වර්ෂ 1996 මාර්තු මස 31 වන දින දෙවිනුවර රජමහා විහාරාධිපති දෙවිනුවර සිරි සුනන්ද අනුනාහිමියන්ගේ යෝජනාවකට අනුව කොග්ගල සිරි විසුද්ධි මහනාහිමියන් අපවත්වීමෙන් පුරප්පාඩු වූ කල්‍යාණිවංශ නිකායේ මහානායක පදවියට පත් මහ නාහිමිපාණෝ විසි හත් වසරකට වැඩි කාලයක් නිකායේ මහානායක පදවිය හොබවන ලද අතර මේ වන විට ලක්දිව වැඩ සිටි දීර්ඝතම මහානායක ධුර කාලය සම්පූර්ණ කළ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වූහ.

එසේම ඒ වන විට කල්‍යාණිවංශ මහානිකාය ශ්‍රී ලංකා අමරපුර මහා සංඝසභාවට සම්බන්ධ වී නොතිබුණු බැවින් අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමියන්ගේ සහ වජිරාරාමාධිකාරී පියදස්සි හිමියන්ගේ මගපෙන්වීම මත කල්‍යාණිවංශ නිකාය අමරපුර මහා සංඝසභාවට සම්බන්ධ කරවන ලදින් 1996 වර්ෂයේ සිට අමරපුර මහා සංඝසභාවේ පාලක සභික හිමිනමක වශයෙන් කටයුතු කොට 2009 වර්ෂයේ එහි උපසභාපති පදවියට පත් වූහ. අමරපුර මහා සංඝ සභාවේ ප්‍රධාන ක්‍රියාකාරී පදවිය සේ ම අමරපුර මහානිකායේ සමස්ත පාර්ශ්වයන්හි අනුනායක පදවිය වශයෙන් සම්මත ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ සභාපති පදවිය සඳහා 2013 වර්ෂයේ දී තේරී පත් වූ මහ නාහිමිපාණන් වහන්සේ එකී පදවියේ පස් වසරක ධුර කාලය සාර්ථකව නිමා කොට 2018 වසරේ මහාමහෝපාධ්‍යාය පදවියෙන් පිදුම් ලැබූහ.

ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක පදවිය හොබවා වදාළ, ධර්මපාල වංශාලංකාර ත්‍රිපිටක විශාරද, අග්ගමහාපණ්ඩිත කොටුගොඩ ධම්මාවාස උත්තරීතර මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වර්ෂ 2021ක් වූ මාර්තු මස 22 වැනි දින අපවත් වී වදාළෙන් පුරප්පාඩු වූ ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක පදවිය සඳහා ජූලි මස 21 වැනි දින අතිපූජ්‍ය දොඩම්පහල චන්දසිරි මහානායක මාහිමිපාණන් වහන්සේ තෝරා පත් කර ගන්නා ලදහ.

බුරුම රාජ්‍යයෙන් අතිසම්භාවනීය අග්ගමහාපණ්ඩිත හා අභිධජමහාරට්ඨගුරු ගෞරවෝපාධීන්ගෙන් ද, පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනින් ස්ථවිර වංශාලංකාර ශාසනකීර්ති ශ්‍රී ගෞරව නාමයෙන් ද, අමරපුර සිරි සද්ධම්මවංස මහානිකායෙන් අමරපුර ගණපාමොක්ඛාචරිය ගෞරව නාමයෙන් ද මහ නාහිමිපාණන් වහන්සේ පිදුම් ලබා තිබේ. මේ හැර තවත් බොහෝ ආයතන විවිධ ගෞරව සම්මාන පිරිනමමින් මහ නාහිමියන්ගේ මෙහෙවර අගය කොට ඇත.

ආරෝහ පරිණාහ දේහධාරීත්වයෙන් ද, කාරුණික හා නිහතමානී ගුණයන්ගෙන් ද දුටුවන්ගේ ප්‍රසාදයට පත්ව වැඩ සිට අපවත් වී වදාළ ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක ධුරන්ධර ව වැඩ විසූ, කලපලුවාවේ ගෝතම තපෝවනය ප්‍රමුඛ තදීය තපෝවන ගණයේ අනුශාසක, අමරපුර කල්‍යාණිවංශ මහා නිකායේ මහානායක, කල්‍යාණිවංශ කීර්ති ශ්‍රී වංගීසවංසාලංකාර, විපස්සනාකම්මට්ඨානාචාර්ය, මහාවිහාර වංශාලංකාර, අමරපුර ගණපාමොක්ඛාචාර්ය, ස්ථවිර වංසාලංකාර ශාසනකීර්ති ශ්‍රී, අග්ගමහාපණ්ඩිත, අභිධජමහාරට්ඨගුරු අතිපූජ්‍ය දොඩම්පහල චන්දසිරි මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට නිවන් සුවය ප්‍රාර්ථනා කරමු.

ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ සභාපති
ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ රාස්සගල පාර්ශ්වයේ මහානායක
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහා නා හිමි**



# සම්බුදු සසුන් කෙතේ අස්වනු නෙළා ගැනීමට ශ්‍රද්ධාවන්තයා අප්‍රමාදී ය

**අතීතයේ බරණැස් නුවර සුමන නම් සිටුවරයෙක් විය. ඔහු දිනපතා දුගී මඟී යාචකාදීන්ට මහා දනයන් දෙයි. ඔහු ඇසුරු කර ජීවත්වන අන්නභාර නම් දුගියෙක් විය.**

එක් දවසක් උපරිට්ඨ නම් පසේබුදුන් වහන්සේ ගන්ධමාදන පර්වතයෙහි නිරෝධ සමාපත්තියට සමවැදී සිට ඉන් නැඟිට අනුග්‍රහ කළ යුත්තකු විමසන්නාහු අන්නභාර නම් දුගියා දැක ඔහුට අනුග්‍රහ කරනු පිණිස ඔහු වනයෙහි සිට සිය නිවෙසට එන වේලාවෙහි පා සිවුරු ගෙන අහසින් වැඩම කර ග්‍රාමද්වාරයෙහි අන්නභාර එන පෙරමග සිටි සේක. දුගී අන්නභාර හිස් පාත්‍රයෙන් සිටි පසේබුදුන් දැක, උන්වහන්සේට වැඳ

“ස්වාමීනි, භික්ෂාව ලද සේක් දැ’යි විචාළේ ය.

“ලබන්නෙමි, මහපිනැතිය”යි පසේ බුදුහු වදාළහ. එකල්හි අන්නභාර

“ස්වාමීනි, මොහොතකට මෙහි ම වැඩ සිටිනු මැනව“යි කියා වේගයෙන් ගෙට ගොස් භාර්යාව අමතා

“සොඳුර, අපට පෙර පින් මඳ බැවින් දිළිඳුව සිටින්නට වී ඇත. අපට දෙනු කැමැත්ත ඇති වූ දාට දෙන්නට දෙයක් නැති වෙයි. දෙන්නට දෙයක් ඇති දාට ප්‍රතිග්‍රාහකයකු නො ලැබෙයි. අද මට උපරිට්ඨ පසේබුදුන් වහන්සේ හමුවූහ. මාගේ බත් පංගුව මේ පාත්‍රයට බෙදා දෙව“යි කීය. නුවණැති බිරිය සිය සැමියාගේ දානයට තමා ද කොටස් කාරියක විය යුතු ය යි සිතා තමාගේ බත් පංගුව ද ඒ පාත්‍රයට බෙදා දුන්නී ය. අන්නභාර පසේ බුදුන් වහන්සේ වෙත පාත්‍රය ගොස් පිළිගන්වා

“ස්වාමීනි, මේ පිනෙන් මම මේ දුප්පත් ජීවිකාවෙන් මිදෙම්වා”යි කීය. “පින්වත, එසේ ම වේවා”යි පසේබුදුන් වහන්සේ වදාළහ. ඉක්බිති අන්නභාර ඔහුගේ උතුරු සළුව බිම අතුරා,

“මෙහි වැඩසිට වළඳනු මැනව“යි කීය. පසේ බුදුන් වහන්සේ එහි වැඩසිට ආහාර වැළඳූ සේක. දන් වැළඳූ පසු අන්නභාර පසේබුදුන් වහන්සේට පාත්‍රය සෝදා ගැනීමට වතුර ද සපයා දින අවසානයේ පසේ බුදුන් වහන්සේ පසේ බුදුවරුන්ගේ සිරිත පරිදි,

**“ඉච්ඡිතං පත්ථිතං තුය්හං -**
**ඛිප්පමේව සමිජ්ඣතු**
**සබ්බේ පූරෙන්තු සංකප්පා -**
**චන්දෝ පණ්ණරසී යථා”**

යි අනුමෝදනා කොට මඟට පිළිපන් සේක. එකල්හි සුමන සිටුගේ ඡත්‍රයෙහි වෙසෙන දෙවියා ඒ දානය දැක,

“අහො දානං පරමදානං උපරිට්ඨෙ සුප්පතිට්ඨිතං” යි තුන්වරක් කියා සාධුකාර දින.

එකල්හි සුමන සිටු ඔහුගේ සාධුකාරය තමාගේ දානය ගැන දුන් සාධු කාරයකැයි සිතා

“කිමෙක් ද මෙතෙක් කල් මා දන් දෙනවා නුඹ නුදුටුවෙහි දැ”යි කීය.

“සිටුතුමෙනි මම ඔබගේ දානයට සාධුකාර දුන්නේ නො වෙමි. අන්නභාර විසින් උපරිට්ඨ පසේ බුදුන්ට දුන් දානයට පැහැදී සාධුකාර දුනිමි”යි දෙවියා කී ය. එබස් අසා සුමනසිටු” මෙය කොතරම් පුදුමයක් ද මෙතෙක් දන් දුන් මට එක දවසකුදු දෙවියන් ලවා සාධුකාර දෙවන්නට නො පිළිවන් විය. මා නිසා ජීවත් වන මේ අන්නභාරට සුදුසු ප්‍රතිග්‍රාහකයකු ලැබීමෙන් එක පිණ්ඩපාත දානයකින් ම දෙවියන් ලවා සාධුකාර දෙවිය හැකි විය. දෙවියන් පවා සාධුකාර දුන් ඒ දානය එසේ මෙසේ එකක් නො විය හැකි ය. එය මහ පිනක් විය යුතු ය. සුදුසු දෙයක් කොට අන්නභාර සතුටු කරවා ඒ දානයත් මා අයත් කරගත යුතුය”යි සිතුවේ ය.

“අහෝ තණ්හාවක සැටි” අපමණ සම්පත් ඇතුව සිට බොහෝ පින් කරමින් සිට ඒවා මදි වි දුප්පතාගේ පිනත් අයත් කර ගන්නට මේ සිටුතුමා සිතී ය.

ඉක්බිති සිටුතුමා අන්නභාර ගෙන්වා, “අද නුඹ යම් කිසිවකුට දානයක් දුන්නෙහි දැ”යි ඇසීය.

“මම අද උපරිට්ඨ පසේබුදුන් වහන්සේට මාගේ බත් පංගුව දුනිමි”යි කී ය. පින් මිලයට ගැනීමේ විකිණීමේ සිරිතක් පෙර ලොව පැවතිණ. දැනුදු ඇතැම් පෙදෙස්වල ඒ සිරිත පවතිනවා විය හැකි ය. ඒ සිරිත පරිදි සිටුතුමා “නුඹ දුන් දානය කහවණුවක් ගෙන මට දෙව“යි කී ය. අන්නභාර “නොදෙමි”යි කීය. සිටුතුමා ක්‍රමයෙන් මිල වැඩි කොට ඉල්ලීය. දහසකට ද නො දෙන බව අන්නභාර කී ය. එසේ නම් දහසක් ගෙන මට පින් දෙව“යි සිටුතුමා කී ය. “එසේ කිරීමත් සුදුසු ද නුසුදුසු ද කියා මම නො දනිමි. පසේ බුදුන් වහන්සේගෙන් අසා, එසේ කිරීම සුදුසු නම් පින් දෙමි”යි සිතා ඔහු පසේ බුදුන් වහන්සේ වෙත ගොස් වැඳ

“ස්වාමීනි සුමනසිටු, නුඹ වහන්සේට දුන් දානයේ පින් දහසක් දී මගෙන් ඉල්ලයි. ඔහුට පින් දෙමි ද නො දෙමි දැ”යි විචාළේ ය. එකල්හි පසේබුදුන් වහන්සේ වදාරන සෙක්

“පින්වත, නුඹට උපමාවක් කියමි, ගෙවල් සියයක් ඇති ගමෙක එක් ගෙයක පහනක් දැල්වෙයි, සෙස්සෝ තෙල් ගැල්වූ පහන්තිර ගෙනවුත් ඒ පහනෙන් දල්වා ගෙන යති, කිමෙක් ද? එයින් පළමු පහනේ එළිය ඇතිවේ ද, නැතිවේ ද?” යි වදාළ සේක. අන්නභාර

“හිමියෙනි පළමු පහනේ එළිය තුබුණාටත් වඩා වැඩිවේය”යි කීය. “පින්වත එමෙන් ම කැඳ සැන්දක් වුව ද දී එයින් ලැබෙන පින අනුන්ට දුනහොත් එයින් තමාගේ පින වැඩෙන්නේ ය. නුඹ එක පිණ්ඩපාතයක් දුන්නෙහි ය, සුමන සිටුට පින් දෙන කල්හි පිණ්ඩපාත දාන දෙකක් වන්නේ ය. ඉන් එකක් සුමන සිටුට හිමි වේ. අනික නුඹට ම හිමි වේ.

හෙතෙමේ පසේ බුදුන් වැඳ සුමන සිටු වෙත ගොස් “පිණ්ඩපාත දානයේ පින් ගනු මැනව“යි කීය. “එසේ නම් කහවණු දහස ගන්න”යි සුමන සිටු කීය. “මම පිණ්ඩපාතය නො විකුණමි, ඔබට සැදැහැයෙන් පින් දෙමි”යි අන්නභාර කී ය.

“පින්වත, නුඹ මට සැදැහැයෙන් පින් දෙව, මම ඔබගේ ගුණයට පූජාවක් වශයෙන් දහසක් දෙමි, එය ගනු මැනව“යි සුමන සිටු කීය. “එසේ වේවා” කියා අන්නභාර කහවණු දහස පිළිගත්තේ ය. ඉක්බිති සුමන සිටු

“පින්වත, දැන් නුඹට මහන්සි වී වැඩ කරන්නට වුවමනා නැත. වීදියේ ගෙයක් සාදා ගෙන සුව සේ වාසය කරව, එසේ වෙසෙන කල්හි නුඹට යම් අඩුවක් වුවහොත් එය මගෙන් ගනුව“යි කී ය.

සුමන සිටු රාජ සේවයට ද යන්නේ ය. රජගෙට යන කල්හි වෙනදා සුමන සිටු අන්නභාර කැඳවා ගෙන නො යන මුත් එදින අන්නභාර ද කැඳවාගෙන රජු වෙත ගියේ ය. අන්නභාරගේ පින් බලය නිසා එදා රජු සිටු දෙස නොබලා අන්නභාර දෙස ම බැලුවේ ය. “දේවයන් වහන්ස, නුඹ වහන්සේ මේ මිනිසා දෙස මෙතරම් බලන්නේ කිම්දැ”යි සිටු කීය, “මොහු පෙර දැක නැති බැවිනැ”යි රජු කීය. “දේවයන් වහන්ස, මේ මිනිසා බැලිය යුත්තෙක් ම ය”යි සිටු කීය. “බැලීමට තරම් වන මොහුගේ ගුණය කවරේදැ”යි රජු කීය.


“මහ රජාණෙනි, මොහු අද තමාගේ බත් පංගුව තමා නොකා උපරිට්ඨ පසේ බුදුන්ට දුන් බැවින් මාගෙන් කහවණු දහසක් පූජා ලැබීය”යි සිටු කීය. “මොහුගේ නම කුමක්ද?” මොහුගේ නම අන්නභාරය”යි සිටු කීය. “නුඹේ අතින් මොහු දහසක් ලද නිසා මාගෙන් ද දහසක් ලැබීමට නිසි ය. මම ද මොහුට පූජාවක් කරමි”යි කියා රජු ද ඔහුට දහසක් දිණ.

ඉක්බිති රජතුමා ඔහුට ගෙයක් සාදා දීමට නියම කෙළෙන් මිනිස්සු ඔහු උදෙසා බිමක් ශුද්ධ කරන්නට පටන් ගත්හ. එහි උදළු පහර ගසන ගසන තැන නිධන් සැළි විය. ඒ බව රජුට දැන් වූ කල්හි රජතුමා ඒ නිධන් සාරා ගොඩ ගන්නට අණ කළේ ය. සාරාත් සාරාත් නිධාන පොළොවෙහි ගැලෙන්නට විය. එකකුදු මතු කළ නොහැකි විය. ඒ බව රජුට දැන් වූ කල්හි රජතුමා

“එසේ නම් අන්නභාරගේ වචනයෙන් සාරව්” යි කීය. අන්නභාරගේ වචනයෙන් ය” කියා සාරන්නට පටන් ගත් කල්හි උදලු පහර දෙන දෙන තැන හතු පිපෙන්නාක් මෙන් නිධන් මතුවන්නට විය. ඒ ධන රාශිය ගෙනැවිත් රජු සමීපයේ ගොඩ ගැසූහ. රජතුමා ඇමැතියන් රැස් කරවා “මේ නුවර මෙතෙක් ධනය අනිකකුට ඇති දැ”යි විචාළේ ය. “නැත දේවයන් වහන්සයැ”යි ඇමැතියෝ කීහ. එසේ නම් “අන්නභාර මේ නුවර ධනසිටු වේවා”යි කියා ඔහුට රජතුමා සිටු තනතුර දුන්නේ ය. ඔහු එතැන් පටන් නොයෙක් පින්කම් කොට මරණින් මතු දෙව්ලොව උපන්නේ ය.

යමෙක් තමාගේ ආහාරය තමා අනුභව නො කොට නිතර අනුන්ට දෙයි නම් එය මහ ගුණයෙකි. දුෂ්කර වැඩකි. මුළු ජීවිත කාලයට ම එක් වරක් තමාගේ බත් පංගුව දීම ලොකු වැඩක් නො වේ. එක බත් වේලක් දීම මහ දෙයක් කෙළේ ය කියා පූජා සත්කාර කිරීමට තනතුරු දීමට තරම් කරුණක් නො වේ. සිටුතුමාගේ හා රජතුමාගේ සිත් අන්නභාරට පූජා සත්කාර කිරීමට තනතුරු දීමට නැමුණේ නිරෝධ සමාපත්තියෙන් නැගී සිටි පසේ බුදුන් වහන්සේට පිණ්ඩපාතය පිරිනැමීමෙන් වූ කුසල බලය නිසා ය. ඔහුට ඒ පිණ්ඩපාත, දානය ඉහාත්මයේ දී ම විපාක දෙන කුසලයක් වූයේ පසේ බුදුන් වහන්සේගේ ගුණ සම්පත්තිය නිසා ය. සාමාන්‍ය පුද්ගලයන්ට එබඳු පිණ්ඩපාත දානයන් දහස්වර දසදහස්වර දුන ද ඒවායින් ඉහාත්මයේ විපාකයක් නො ලැබේ.

***(රේරුකානේ චන්දවිමල මහ නා හිමිපාණන්ගේ සුවිසි මහ ගුණ ග්‍රන්ථයෙනි)***



**රේරුකානේ චන්දවිමල මහා නා හිමි**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
දුරකථන - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

වෙසක් අමාවක 2023-05-19

## ප්‍රතිපත්තිගරුක වීම

අතීතයේ ලක්දිව අම්බරිය නම් විහාරයක් විය. පිංගල බුද්ධරක්ඛිත නම් තෙරුන් වහන්සේ එහි වැඩ විසූහ. නිතර එම විහාරස්ථානයට යන එන ගොවියෙක් උන්වහන්සේගෙන් පන්සිල් සමාදන් විය. ඒ ශීල ප්‍රතිපත්තිය උතුම් කොට ආරක්ෂා කළේ ය.

දිනක් කුඹුරේ වැඩට ගිය ගොවියාගේ ගොනුන් නැති විය. උන් සොයා ගිය ගොවියා අවසානයේ උත්තර වර්ධමාන පර්වතය දෙසට ද ගියේ ය. මහා වනාන්තරයේ දී ඔහු පිඹුරකු විසින් වෙළා ගනු ලැබුවේ ය. තමන් අත වූ වෑයෙන් පිඹුරාට පහර දී ගැලවී යන්නට ගොවියාට සිතුණි. එහෙත් ඒ හා සමගම අම්බරිය වෙහෙර වැසි බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ සිහියට නැඟුණි. සමාදන් වූ සිල්පද මතක් වුණි. ඔහු පිඹුරා නැසීමේ අදහස වෙනස් කළේ ය. පිඹුරා වෙළුම තව තවත් තද කරන්නට විය. ගොවියාට දැඩි වේදනාවක් දැනුණි. එය බලවත් වෙත්ම නැවත ද වෑයෙන් පහර දී පිඹුරා මරා දමන්නට ආවේගයක් ඇති වුණි. ඒ හා සමගම ගොවියාට තමන් සමාදන් වූ සිල්පද සිහියට නැඟුණි. බුද්ධ රක්ඛිත තෙරුන් වහන්සේ සිහිපත් වුණි. පිඹුරා මරා දැමීමේ අදහස එවර ද ගිලිහී ගියේ ය. පිඹුරා ද සිත් සේ වෙළුම තද කරමින් සිටී. දැන් ගොවියාට දැනෙන වේදනාව ඉවසුම් නොදෙන තරම් ය. තෙවැනි වර ද පිඹුරා මරා දමන්නට සිතීය. එහෙත් සිල්පද සිහියට නැඟුණි. පිඹුරා මරා දමන්නට සිතෙන්නේ මේ ආයුධය මා අත වන නිසා ය. මගේ දිවි තොර වුව ද සිල් බිඳ ගන්නට නොහැකි යැයි සිතූ ගොවියා තමන් අත වූ වෑය ඉවතට විසි කර දැමුවේ ජීවිතය ගැන වූ ආශාව අත්හරිමිනි.

සිදු වූයේ මහා පුදුමයකි. පිඹුරා ක්ෂණයෙන් සිය ග්‍රහණය බුරුල් කළේ ය. උපාසක අතහැර වනයට ම ඇදී ගියේ ය. ඒ සිල්පද රැකීමේ අනුසස් ය. සාන්දෘෂ්ටිකව ම ලැබූ ඵලයන් ය.

මේ කතා පුවත බෞද්ධයින් අතර නොදන්නා කෙනෙක් නොමැති තරම් ය. උතුම් තෙරුවන් සරණ ගිය, සිල් ආරක්ෂා කරන උපාසකයකු සතු ප්‍රතිපත්තිගරුක බව මොනවට විද්‍යමාන වන මෙවැනි කතා පුවත් දැන ගැනීමට පමණක් සීමා වූ කල වන සුගතියක් නොවේ. ඒ කතාර්ථයන් ජීවිතයට ප්‍රායෝගික විය යුතු ය.

අද බෞද්ධයන් බොහෝ දෙනෙක් තථාගතයන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය පිළිබඳ දැනුමෙන් සුපෝෂිත ය. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් ඔස්සේ සමාජ මාධ්‍යයන් ඔස්සේ ධර්මය පිළිබඳ අසන්නට, කියවන්නට, දැනගන්නට ලැබේ. එසේ සන්නිවේදන මාර්ග පුළුල් වී තිබුණ ද ඉන් ප්‍රයෝජන ගන්නා පිරිස් විරල බව කුඩා දරුවකුට වුව පසක් වන තරමට ඇතැම් තැනෙක කනගාටුදායක හැසිරීම් දක්නට ලැබේ.

තථාගත ධර්මයට අනුව ජීවත්වන්නා ය දැහැමි පුද්ගලයකු වන්නේ. ඔහු කිසිදු අවස්ථාවක දහමට පිටු නොපායි.

ශ්‍රී සද්ධර්මය තුළ ගිහියාට නිත්‍ය ශීලයක් හඳුන්වා දී තිබේ. ඉන් එහාට යමින් සිඟාලෝවාද, මහා මංගල, ව්‍යග්ඝ පජ්ජ ආදී බොහෝ සූත්‍ර දේශනාවන් තුළින් මේ සමාජය තුළ ජීවත්විය යුතු ආකාරය පහදා දී තිබේ. ලෝභ, ද්වේෂ, මෝහාදී කෙලෙස් ගින්නෙන් දැවෙන සිත අලෝභ, අද්වේෂ, අමෝහ ආදී කුසල චේතනාවන්ගෙන් නිවා සනසා ගන්නා සැටි සම්බුද්ධ දේශනාවේ උගන්වා තිබේ.

ඉදින් බෞද්ධයකුට සම්බුදු සරණ හැර, සදහම් සරණ හැර, පින්වත් සංඝරත්නයේ සරණ හැර අන් කවර සරණක් ද? ඒ රැකවරණය ලබන්නට නම් දිවි තොර වුව ද දහමට පිටු නොපෑ යුතු ය. පෙර කී උපාසක මෙනි. එවිට කවර විපතක් හමුවේ වුව ද ජීවිතාරක්ෂාව වියැකී නොයනු ඇත.

කුඩා දරුවාගේ සිට වයෝවෘද්ධ පිරිස් දක්වා ම දහමට අනුව ජීවිතය හසුරුවා ගැනීමේ වටිනාකම නැවත නැවත මනසට ගෝචර කළ යුතු කාලය එළඹ තිබේ.

# දියුණුවන්නාගේ රහස අප්‍රමාදී බවයි

**"අප්පමාදය" නම් දන ශීලාදී කුසලයන් සිදු කිරීමෙහි පවතින්නා වූ යහපත් සිහියයි. මෙය ආර්ය අෂ්ඨාංග මාර්ගයෙහි දී සම්මා සති ලෙසින් හඳුන්වා දී ඇත. මෙම යහපත් සිහිය සෑම තැනක දී ම, සෑම අවස්ථාවක දී ම පවත්වා ගත යුතු මංගල ධර්මයකි. එසේ නැතිවීම තුළ නිර්මාණය වන්නේ ම ප්‍රමාදයයි.**

ආර්ය සමාධිය හා ප්‍රඥව වැඩීමෙන් සංවර නොකළා වූ පෘථග්ජන පුද්ගලයාගේ සිත කායාදි ත්‍රිවිධ දුශ්චරිතයන් කෙරෙහි මෙන් ම පස්කම් සුව විඳීමෙහි ද නැමී බර වී පවතී. දුශ්චරිත සිදු වන්නේ යමකුගේ සිත සිහියෙන් තොර වූ විටය. එමෙන් ම ඒ පුද්ගලයා පස්කම් රසයෙහි ඇලීමෙන්, ගැටීමෙන් දෙලොව ම මහත් වූ දුකට පත් කර ගනී. එහෙයින් ප්‍රමාදය දෙලොව ම පරිහානියට ගෙන යන පාප ධර්මයක් සේ වටහා ගත යුතු ය. එමෙන්ම අප්‍රමාදය දෙලොව අභිවෘද්ධිය සලසාලන ආර්ය ධර්මයක් බව ද හොඳින් අවබෝධ කර ගත යුතු ය.

ආහාර, වස්ත්‍රාභරණ, යාන – වාහන, මිල මුදල් ඇතිව, සිහි නුවණින් යුතුව, නොයෙක් සිප් සතර ඉගෙන යහපත් වූ දරු පවුලක් ඇතිව, බොහෝ නෑ – හිතමිතුරන් ඇතිව, ගරු බුහුමන් ලබමින් සත්පුරුෂ ගුණධර්ම ඇතිව ජීවත්වීමට ලැබීම මෙලොව දියුණුවයි.

මරණින් මතු අපායට නොවැටී සුගතියක උපත ලබා සම්පත්තීන් හිමි කර ගනිමින් සතුටු වන්නට ලැබීම පරලොව දියුණුවයි.

නුවණැති පුද්ගලයා මේ දෙයාකාර වූ දියුණුව ම ලබා ගන්නේ ය. නුවණ මඳ තැනැත්තාගේ මෙලොව ජීවිතය අභාග්‍ය සම්පන්න ය. ආහාර, ඇඳුම් – පැළඳුම්, වාසස්ථාන අවශ්‍ය තරම් නොලබන්නේ ය. ණයගැති ය. එහෙයින් දුකින්ම කල් ගෙවයි. පව්කම්හි බිය නොදැකීම නිසා මරණින් මතු ද අපායට පැමිණේ. මෙලෙස දෙලොවින් ම පිරිහේ.

ඇතැමෙක් කළ යුතු දෙය අමතක කරති. ඇතැමෙක් මෙලොව සැප විඳීමට පමණක් බලාපොරොත්තු වෙති. ඒ සඳහා පව පින නොසලකති. එසේ බලාපොරොත්තු වන්නා මෙලොව යම්කිසි භෞතික සැපයක් ලැබුව ද, පරලොව පිරිහීම නම් නියතය.

වැරැදි මාර්ගයකින් ලබන මෙලොව දියුණුවත් අවදානම් ය. වැරැදි මාර්ගයකින් ලබන දියුණුව ආපසු පෙරළා එන කල්හි මුළු කාලය තුළ ම හරි හම්බ කරගත් ධනය විනාශයට පත්වේ. සමහරවිට ජීවිතය පවා නැති වේ. මෙලොව වශයෙන් සැප සඳහා කරන පාපී ක්‍රියා නිසා ඔහු නරකයට ගෙන යයි. අවුරුදු දහස් ගණනින් අපා දුකක් විඳින්නට සිදුවෙයි. සිය ගණන් ජාතීන්හි ප්‍රේත බවට, තිරිසන් බවට පැමිණ දුක් විඳින්නට ද සිදුවේ.

කණ කැස්බෑවා විය සිදුරෙන් අහස දකින්නේ ඉතාමත්ම කලාතුරකිනි. එය සිතා ගැන්ම පවා අපහසු ය. මිනිස් ජීවිතයක් ලැබීම ඒ සා දුර්ලභ ය. එසේ ලැබූ ජීවිතයත් ඉතා කෙටි කාලයකි. එහෙත් ඒ මනුෂ්‍යයාට පරලොවට අයත් වූ කාලය අවුරුදු ගණනින් තබා කල්ප ගණනින් ද දැක්විය නොහැකි දීර්ඝ වූ කාලයකි. එබැවින් අනාගතයේ අපායට යන්නට නොවන පරිදි කටයුතු සිදු කරගත හොත් මෙලොව ජීවත්වන කෙටි කාලය දුකින් ජීවත් වූවාට කම් නැත. කෙටි කාලයක සැපයක්, සතුටක් හේතුවෙන් දීර්ඝ කාලයක් විඳිය යුතු දුකක් අත්පත් කර ගන්නේ ඇයි?

මනසින් දියුණුවක් ලැබූ තැනැත්තා සුළු සැපයක් හේතුවෙන් විශාල සැපයකට හානියක් කර නොගනියි. මනස දියුණු ඇත්තන්ගේ ස්වභාවය නම් විශාල සැපය නිසා සුළු සැපය අත්හැරීම ය.

> **"පරලොව පිළිබඳ කාලය ඉතා දීර්ඝ බැවින් මෙලොව සැපයට ද, මෙලොව දියුණුවට ද වඩා පරලොව යහපත පරලොව දියුණුව ගැන බැලිය යුතු ය. පරලොව විඳින්නට වන මහා පරිහානිය නො බලා මෙලොව ස්වල්ප වේලාවකට ලැබෙන සැපය සඳහා අකුසල් කිරීම හරියට ශීත කාලයේ දී ජීවත්වන ගෙට ගිනි තබා ගිනි තැපීම වැනි අනුවණකමකි. ඒ නිසා මෙලොව කොපමණ මහත් වූ දෙයක් සඳහාවත් මරණීන් මතු අපාගත වන්නට සිදුවන දෙයක් නො කළ යුතුයි."**

පරලොව පිළිබඳ කාලය ඉතා දීර්ඝ බැවින් මෙලොව සැපයට ද, මෙලොව දියුණුවට ද වඩා පරලොව යහපත පරලොව දියුණුව ගැන බැලිය යුතු ය. පරලොව විඳින්නට වන මහා පරිහානිය නො බලා මෙලොව ස්වල්ප වේලාවකට ලැබෙන සැපය සඳහා අකුසල් කිරීම හරියට ශීත කාලයේ දී ජීවත්වන ගෙට ගිනි තබා ගිනි තැපීම වැනි අනුවණකමකි. ඒ නිසා මෙලොව කොපමණ මහත් වූ දෙයක් සඳහාවත් මරණීන් මතු අපාගත වන්නට සිදුවන දෙයක් නො කළ යුතුයි.

මිනිසාට මෙලොව සැපය ද මෙලොව දියුණුව ද අවශ්‍යයයි. ඒ සැප හා දියුණුව පරලොව පිරිහීමට හේතු නො වන පරිදි නුවණින් සිදුකර ගත යුතු ය.

මෙලොව දියුණුව මෙන් ම පරලොව දියුණුව ලබා ගන්නා වූ මනුෂ්‍යයා ශ්‍රේෂ්ඨ පුද්ගලයා ය. නියම මනුෂ්‍යයා ය. එම ජීවිතය ම සඵල වූ හිස් නොවූ ජීවිතයක් වන්නේ ය. නුවණැත්තන්ගේ ප්‍රශංසාවට භාජනය වූ ජීවිතයක් වන්නේ ය. බුද්ධාදි උතුමන්ගේ වර්ණනාවට පාත්‍ර වූ උතුම් ජීවිතයක් වන්නේ ය.

මෙලොව, පරලොව දෙලොව දියුණුවට කැමැති වුවත් දියුණුවේ නියම මාර්ගය, දියුණුවේ රහස තත් වූ පරදි නොදැන, නොමඟ ගමන් කළහොත් ඒ දියුණුවට පැමිණිය නොහැකි වන්නේ ය.

ඒ නිසා දෙලොව දියුණුව ප්‍රාර්ථනා කරන අය විසින් දියුණුවේ නියම මාර්ගය සොයා ගත යුතු ය. දියුණුවේ එකම මාර්ගය අප්‍රමාද බව හෙවත් කුසල් කිරීමේ නොපමා බව යැයි දත යුතු ය.

දීපා පෙරේරා



# විනය ශාසනයේ ආයුෂය යි



**විනය යනු හික්මීම යි. ගිහි පැවිදි කා හටත් විනය නීති රීති අවශ්‍ය වේ. සමාජයක ප්‍රධාන වශයෙන් ගිහි පැවිදි යනුවෙන් කොටස් දෙකක් පවතී. එයද,නැවත භික්ෂු, භික්ෂුණී හා උපාසක, උපාසිකා වශයෙන් කොටස් හතරකට බෙදා දක්වා ඇත.**

එය බුද්ධ ශාසනයේ සිව්වනක් පිරිස වශයෙන් හඳුන්වා ඇත. මේ කුමන ආකාරයකින් බෙදුවද රටක, සමාජයක පැවැත්ම උදෙසා සෘජුවම බලපාන මාතෘකාවක් ලෙස විනය හැඳීන්වීමට පුළුවන. හික්මීම, සංවරකම, ශීලාචාරකම ආදී වචනවලින් ද විනය පිළිබඳ අර්ථවත් වේ. ගිහි විනය පිළිබඳ කතා කිරීමේ දී, පැවිදි විනය පිළිබඳ මදක් අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ උදෙසා පනවන ලද විනය ප්‍රාතිමෝක්ෂය තුළ ඇතුළත් වන්නේ පැවිදි පක්ෂයට අදාළ ශික්ෂා පදයි. එය බුදු සසුනේ චිර පැවැත්මයි.

“විනයෝ නාම සාසනස්ස ආයු” විනය ශාසනයේ ආයුෂ යි. බුදුරජාණන් වහන්සේ අවුරුදු 20ක් ම ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කළහ. “සබ්බ පාපස්ස අකරණං” යනුවෙන් පැහැදිලි වන්නේ එය යි. එසේ අවස්ථානුකූලව අවවාද අනුශාසනා කිරීම තුළින් භික්ෂු විනය ආරක්ෂා කර ගැනීමට පුළුවන් විය.

නමුදු අවුරුදු 20ක් ඉක්මවීමත් සමඟ ඕවාද ප්‍රාතිමෝක්ෂය ප්‍රමාණවත් නොවීය. එනිසා බුදුරජාණන් වහන්සේට විනය ශික්ෂා පද පැනවීමට සිදුවිය. එය ආනා ප්‍රාතිමෝක්ෂය වශයෙන් භික්ෂු, භික්ෂුණීන් උදෙසා දේශනා කරන ලද්දකි.

එනම් පැවිදි පක්ෂය උදෙසා ඔවුන්ගේ විනය ආරක්ෂා කර ගැනීම සඳහා කළ දේශනාවකි. භික්ෂූන් වහන්සේ උදෙසා පනවන ලද එම විනය ශික්ෂා පද වර්තමානය තෙක්ම බුදු සසුන ඉදිරියට පැවතීමට හේතු විය. අද වුව ද බුදු සසුන ආරක්ෂා වී ඇත්තේ එම ශික්ෂා පද භික්ෂූන් වහන්සේ ආරක්ෂා කිරීම තුළිනි. පැවිදි පක්ෂයේ බුදුරජාණන් වහන්සේ උදෙසා දේශනා කළ විනය නීති රීති සංඛ්‍යාත්මක වශයෙන් ගත් කල්හි 220කි. පැවිදි පක්ෂයේ භික්ෂුණීන් වහන්සේ උදෙසා දේශනා කළ විනය නීති රීති සංඛ්‍යාත්මක වශයෙන් ගත් කල්හි 304කි.

පළමුව පැවිදි පක්ෂ උදෙසා විනය ශික්ෂා පද දේශනා කළ බුදුරදුන් දෙවනුව ගිහි පක්ෂය උදෙසා ද විනය පිළිබඳ දේශනා කළහ. ඒවා බොහෝ දුරට සමාජයක් සදාචාර සම්පන්නව ඉදිරියට පවත්වා ගෙන යාම උදෙසා යුතුකම් හා වගකීම් මත තහවුරු කොට තිබීම ඉතා වැදගත්වන්නකි.

වෙන් වෙන් වශයෙන් ගෙන එක් කොටසක් පමණක් විනය ගරුකවීම ප්‍රමාණවත් නොවන්නකි. පැවිදි පක්ෂය ද, ගිහි පක්ෂය ද විනය ගරුක විය යුතුය. මෙහිදී අප සාකච්ඡාවට ලක් කරන්නේ ගිහි සමාජයේ විනය නොහොත් හික්මීම සම්බන්ධව දේශනා කළ කරුණු සමුදායක් පිළිබඳ ය. සිඟාලෝවාද සූත්‍රය, ව්‍යග්ගපජ්ජ සූත්‍රය, වසල සූත්‍රය, පරාභව සූත්‍රය ආදී සූත්‍ර ගිහි සමාජයේ විනය සම්බන්ධව වැදගත් ඒවා ය.

ඉහත දක්වන ලද විනය ශික්ෂා භික්ෂු - භික්ෂුණී දෙපක්ෂයට ම ඉතා වැදගත් වන්නකි. එයට හේතුව බුදුරජාණන් වහන්සේ ආරම්භ කළ ශාසනයේ සජීවී ඒකකය වන්නේ පැවිදි පක්ෂය යි. මුල් කාලයටත් වඩා වර්තමානය හා අනාගත කාලය සඳහා බුදු සසුන තරමක් දුරට හෝ රැකබලා ගැනීමට එම විනය ශික්ෂා පද ඉතා වැදගත් වේ. ශාසනයට ඇතුළත් වන්නන් ගත් කල්හි විවිධ අය වන්නාහ. ඒ සෑම කෙනකුට ම ස්වයං පාලනයක් සිදු කර ගැනීමට අපහසු බැවින් විනය ශික්ෂා පද පිළිබඳ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. ඒ විනය ශික්ෂා පද පිළිබඳ අවධානය යොමු කරවීමෙන් සිතින්, කයින්, වචනයෙන් තරමක් දුරට හෝ පාලනය වීමට සිතනවාට කිසිදු සැකයක් නැත. හිරි ඔතප් නම් වූ ලෝක පාලක ධර්ම ඇතිකොටගෙන මේ බුදු සසුන තුළ හික්මීමට උත්සාහවත් වෙති.

අනාගතයේ දී අන්තර්ධාන පහක් සිදු වනු ඇත. එනම් අධිගම, ප්‍රතිපත්ති, පර්යප්ති, ලිංග, ධාතු වශයෙනි. මේ අන්තර්ධාන පහ සිදු වූ කල්හි බුදු සසුන ද අන්තර්ධාන වේ.

විශේෂයෙන් හොඳින් නොඇසීම, සකසා පාඩම් කර නො ගැනීම, සකසා සිතට නො ගැනීම, සිත්හි ධාරණය කර ගත් ධර්මය හොඳින් අභ්‍යාස නො කිරීම සහ ධාර්මිකව ජීවත් නොවීම යනාදී කරුණු හේතු කොටගෙන ශාසන අන්තර්ධානය සිදු වන ආකාරය අංගුත්තර නිකාය තුළ පැහැදිලි කොට ඇත.

ගිහි විනය හැටියට දී:නි සිඟාලෝවාද සූත්‍රය තුළින් ප්‍රකට කොට ඇත්තේ ගිහි සමාජයේ ප්‍රගමනයට හේතුවන කරුණු සමූහයකි. එහිදී බැහැර කළ යුතු පාප ක්‍රියා දාහතරක් දක්වා ඇත. එනම් සතර කර්මක්ලේස, සතර අගති, ධන විනාශමුඛ හය ආදි වශයෙනි.

එම අන්තර්ගතය හරහා සමාජයේ පැවතිය යුතු සියලු පැතිකඩ නිරූපණය වන්නාහ. ඒවා තුළින් මිනිසකුගේ ලෞකික පිරිහීමත්, ලෝකෝත්තර පිරිහිමත් සිදු වේ. එසේම මිනිසකුගේ ලෞකික දියුණුව හා ලෝකෝත්තර දියුණුව උදෙසා හේතු වන්නේ එම පිරිහීමේ කරුණුවලින් වැළකී සිටීමෙන් ය. සිඟාලෝවාද සූත්‍රය තුළ යුතුකම් හා වගකීම් පිළබඳ දේශනා කිරීමේ දී ඉහතින් මතක් කළ බැහැර කළ යුතු පාප ක්‍රියා පිළිබඳ අවධානය යොමු කිරීම ප්‍රධාන සාධකය යි. එයට හේතුව සමාජයක් ඉදිරියට ගමන් කළ යුත්තේ විනයත්, හීක්මීමත් මත බැවිනි. එසේ නොමැති වුවහොත් එම සමාජය කොතරම් භෞතික දියුණුවක් ලැබුව ද ගුණධර්ම නොමැති, පින්, පව් නො හඳුනන ගෝත්‍රික සමාජයක් බවට පත්වීම වැළැක්විය නොහැකිය.

ගිහි සමාජයේ ප්‍රගමනයට සිඟාලෝවාද සූත්‍රයේ කරුණු ඉදිරිපත් කළ ද, විනය සම්බන්ධව කතා කිරීමේ දී ශීලය ප්‍රගුණ කිරීම ඉතා වැදගත් කොට සලකා ඇත. ඒ සඳහා පංචශීලය ප්‍රධාන වශයෙන් ගිහි සමාජයට වැදගත් වේ. ඊට අමතරව අෂ්ඨාංගික ශීලය, නවාංග උපෝසථ ශීලය, දස ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීව පාරිශුද්ධ ශීලය ප්‍රගුණ කිරීම ද ඉතා වැදගත් වේ.

ශීලය ප්‍රගුණ කිරීම උදෙසා වත්පිළිවෙත් පිරීම අතවශ්‍ය අංගයකි. එයට හේතුව එතුළින් තුනුරුවන් උදෙසා ගෞරවය වැඩි වී ඒ හරහා ඉන්ද්‍රියන් තුළ මනා හික්මීමක් සිදු වන බැවිනි.

වත් සම්පූර්ණ නොකරන්නේ, ශීලය සම්පූර්ණ නො කෙරේ. ශීල ශුද්ධිය නො ලබන්නේ, සිතේ සමාධිය නො ලබයි. වික්ෂිප්ත සිත් ඇත්තේ, ධර්මය නො දකී. ධර්මය නො දක්නෝ දුකින් නො මිදේ.

වත් පිළිවෙත් කිරීමෙන් තිදොරම සංවර වන බැවින් තිදොරින් සිදුවන සියලු පාප ක්‍රියා සිදු නොවීමට එය මහඟු පිටුවහලක් වන්නාහ. ඒ වගේම ගිහි විනය සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී හිරි ඔතප් දෙක ද වැදගත් වේ. සප්තාර්ය ධනය පිළිබඳ විමසීමේ දී හිරි ඔතප් දෙකත්, ආර්ය ධනයක් හැටියට දේශනා කොට ඇත. පව් කිරීමට ඇති ලජ්ජාව හිරිය යි. පව් කිරීමට ඇති බිය ඔත්තප්පය යි.

තම ශාස්තෘවරයාගේ උසස් ගුණය, තම දෙමාපියන්ගේ වැදගත්කම, තම ගුරුවරයාගේ ගරු කටයුතු බව ආදිය තමාගේ නුවණින් ම සලකා බලා වැරැදි වැඩ කළහොත් ඒ උතුමන්ටත් තමාටත් මදිකමක් සේ සිතා කෙනකු වැරැදි වැඩවලින් මිදෙන්නේ හිරිය නොහොත් පවට ඇති ලජ්ජාව නිසා ය.

මේ ලජ්ජාව බාහිර බලපෑමක් නිසා නොව කෙනකුගේ අභ්‍යන්තරයෙන් ම පැන නඟින්නකි. පව් කිරීමට ඇති බිය ද හතරාකාරයකි. එනම්

අත්තානුවාද භය (තමා කළ පව් සිහිවීමෙන් තමාගෙන් ම දොස් නැඟී තමාට පසුතැවිලි වන්නට වේ යැයි ඇති වන බිය

පරානුවාද භය (තමාට අනුන්ගෙන් දොස් නැඟෙතැයි ඇති වන බිය

දණ්ඩ භය (වැරැදි වැඩක් කිරීමෙන් තමන්ට දඬුවම් ලබන්නට සිදුවෙතැයි ඇතිවන බිය)

දුග්ගති භය (මේ පව් කිරීමෙන් අපාගතවීමට සිදුවෙතැයි ඇතිවන බිය)

සමස්තයක් වශයෙන් ගත් කල්හි ඉහතින් සඳහන් කරන ලද කරුණු කාරණා සියල්ලක් ම ගිහි සමාජයක් විනය ගරුකව හා සදාචාර සම්පන්නව ඉදිරියට පවත්වා ගෙන යෑමට මහෝපකාරී වන්නාහ. විශේෂයෙන් ගිහි පින්වතුන් නිවසේ සමාජයේ ජීවත් වන විට ඉහත කරුණු පිළිබඳ අවධානයක් යොමු කොට සිහියෙන් යුක්තව කටයුතු කිරීම කාගේත් යහපත උදෙසා හේතු වන්නකි.

තමන්ටත්, අනුන්ටත් මෙලොවටත්, පරලොවටත් යහපත කැන්දන විනය නොහොත් හික්මීම පිළිබඳ අද වෙනදාටත් වඩා වැඩි අවධානයකින් කටයුතු කළ යුතුව ඇත. මේ සංකීර්ණ ලෝකයේ ජීවත්වීමේ දී පංච ඉන්ද්‍රියයන්ට හසුවන සියලු දේ ම ග්‍රහණය නො කොට ගෙන ජීවිතය අවුල් නොකොට ගෙන ජීවත් විය යුතු ය. ඒ සඳහා බුදුරදුන් දේශනා කළ එම විනය සම්බන්ධ කරුණු කාරණා පිළිබඳ තව තවත් අධ්‍යනය කොට දෙමාපිය - දූ දරු, ස්වාමි - භාර්යා, ගුරු- සිසු ,ස්වාමි - සේවක, ගිහි පැවිදි සම්බන්ධතාවයක් නිරවුල්ව හා ශක්තිමත්ව පවත්වාගෙන යෑමට සියලු දෙනා අධිෂ්ඨානය කර ගැනීම ඉතා වැදගත් වනු ඇත.



මහව,උඩගම ශ්‍රී ඉන්ද්‍රසුමන මහ පිරිවෙන්හි ප්‍රවීණාචාර්ය , ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛන ශාස්ත්‍රී

**ගලගෙදර රතනවංස හිමි**

# සැබෑ ආලයේ හිමිකරුවා කවුරුද?

**බුදු දහම නිර්වාණය ම ඉලක්ක කරගත් දහමකි. නමුත් ලෞකික ජීවිතය සාර්ථක නො කරගත් නිර්වාණගාමී මාර්ගයක් බුදු දහමේ දහමේ අන්තර්ගත නොවේ.**



පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ
රාජකීය පණ්ඩිත
**පයාගල සුමනසාර හිමි**

ලෞකික ජීවිතය හෙවත් පුද්ගලයා සැරිසරන වටපිටාව නොයෙක් බැඳීම් මත පදනම් ව ගලා යන්නකි. උදාහරණයක් ලෙස දෙමාපිය, දූ දරු, ගුරු ශිෂ්‍ය, හිතමිතුරු, නෑදෑ හිතමිතුරු, අඹුසැමි බැඳීම් පෙන්වාදිය හැකි ය.

සමාජයේ එක් පුද්ගලයෙක් තමා සිටින ස්ථානය අනුව විවිධ භූමිකා රඟ දක්වති. ඒ භූමිකාවන්ට පැවරෙන යුතුකම් හා වගකීම් සිදුකරති. එය අනුව බැඳීම් ලෝකයේ පවතී. එකිනෙකා අතර අන්‍යොන්‍ය බැඳීම් පවතින විට එකිනෙකාට ප්‍රියකරති. ආලය ද වඩති. බුදු දහමට අනුව අප කාට ආලය කළ යුතු ද යන්නට පිළිතුරක් සැපයීමට මෙහිදී උත්සාහවත් වනු ලබයි.

ත්‍රිපිටක සූත්‍රවලින් සංයුක්ත නිකායේ කෝසල සංයුත්තයේ බන්ධන වග්ගයට අයත් මල්ලිකා සූත්‍රය පුද්ගලයකු සැබැවින් ම ආලය කළ යුත්තේ කාහට දැයි පහදා දෙයි. මල්ලිකා සූත්‍රයේ පවතින නිදාන කතාව අප විමසා බලමු. දිනක් කොසොල් මහරජතුමා මල්ලිකා දේවිය හමුවට ගොස් දැඩි ආලයෙන් පැනයක් අසයි. එය සූත්‍රයේ සඳහන් වන්නේ

"අත්ථි නු ඛො තෙ මල්ලිකෙ චඤ්ඤො, අත්තනා පියතරරොති" යනුවෙනි. මල්ලිකාවනි, තමාට වඩා ප්‍රිය වූ වෙනත් අයෙක් සිටීද යන්න එහි අර්ථය යි.

එවිට මල්ලිකා දේවිය පිළිතුරු ලබා දුන්නේ

"නත්ථි නු ඛො මේ මහාරාජ ඛො චඤ්ඤො පියතරොති" මහරජ මට වඩා ප්‍රිය වූවෙක් මා හට නොවේ යැයි යනුවෙනි.



**සමාජයේ එක් එක් පුද්ගලයා තමා සිටින ස්ථානය අනුව විවිධ භූමිකා රඟ දක්වයි. ඒ භූමිකාවන්ට පැවරෙන යුතුකම් හා වගකීම් සිදුකරයි. එය අනුව ලෝකයේ බැඳීම් පවතී. එකිනෙකා අතර අන්‍යොන්‍ය බැඳීම් පවතින විට එකිනෙකාට ප්‍රියකරති.**

නමුත් කොසොල් රජු අපේක්ෂා කළේ මල්ලිකා දේවියගෙන් එබඳු පිළිතුරක් නොවේ. තමා ප්‍රිය වූවෙක් ඇත්නම් ඒ ප්‍රිය මහරජු වේ යැයි ආදී පිළිතුරකි. සරලව අන්‍යොන්‍යව ආදරය කරන්නවුන් එකිනෙකා ගැන ඇති ආල හැඟීම් ප්‍රකාශයකි. රජු මල්ලිකා දේවිය හා සංවාදයෙන් ලද කළකිරීමෙන් බුදුරදුන් හමුවේ සිදු වූ පුවත ප්‍රකාශ කිරීමෙන් පසුව බුදුරජාණන් වහන්සේ ද පිළිතුරු ලබා දුන්නේ පහත සඳහන් ගාථා පාඨයෙනි.

සියලු දිසාවන්හි බැලුව ද තමාට වඩා ප්‍රිය වු කිසි අයෙක්, කිසි තැනකවත් නොලැබූ බවත් ලොවෙහි සියලු දෙනාට ම තම තමන් ප්‍රිය වන බවත් ය. එහෙයින් තමාට ප්‍රිය වූ පුද්ගලයා, තමන් නොපෙළන්නෙක් වන්නේ ය යනුවෙනි.

බුදුරජාණන් වහන්සේ ලබා දුන් උපදේශය අනුව තමන් නො පෙළන්නෙක් ලෙස කටයුතු කරන්නේ කෙසේ ද යන්න තවත් වක්‍රව නැඟෙන ගැටලුවකි. එයට ද බුද්ධ උපදේශය ම සලකා බැලීම වටී.

බුදු දහමේ පෙන්වා දෙනු ලබන්නේ අකුසලයන්ගෙන් වැළකී කුසලයන් රැස් කර ගනිමින් දිවි ගත කරන්නා තමාට ම ආලය කරන්නකු බවයි. තමන් නො පෙළන්නෙක් බවයි.

තමා ආරක්ෂා වීම බුදු දහමේ බාහිර ප්‍රශ්න ගැටලුවලින් මිදී, සැඟවී සිටීමෙන් සිදු නොවන බව අවධාරණය කරයි.

මිනිසකු තම ජීවිත කාලය පුරාවට දොර අගුළු දමා වැසූ නිවසක වෙසෙමින් අකුසල් කරයි නම් ඔහු තමා රකින්නකු නොවන බවත්, එළිමහනේ සිට වුව ද සමාජයේ ගැටෙමින් කුසල් රැස් කරන අයකු නම් ඔහු තමා ආරක්ෂා කරන්නෙකු, තමාට ම ප්‍රිය වන්නකු, තමාට ම ආලය කරන්නකු වන බව බුදු දහමේ පෙන්වා දෙයි.

ධම්මපද පාලියේ අත්ත වග්ගයේ පළමු ගාථාවෙන් නිරූපණය කෙරෙන පරිදි කුසල් රැස් කරන පුද්ගලයා "තිණ්ණමඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය පණ්ඩිතො" තමාට ම ප්‍රිය වූ පුද්ගලයකු බවට පත්වීමේ දී තුන් වයසින් එක්තරා වයසක දී අකුසල් දුරු කොට තමා රැක ගත යුතු බව පෙන්වා දෙයි. එම අවස්ථා තුන ධම්මපද අටුවාවේ දක්වා තිබෙන්නේ මව්කුස තුළ සිටිය දී , තරුණ වියේ දී හෝ මුහුකුරා ගිය මොහොත යන අවස්ථාවන් තුනේ දී ය. ඒ අනුව අපි ඉහත දැක්වූ අවස්ථාවන් තුනෙන් එක් අවස්ථාවක දී තමා රැකීම පිණිස කුසල් රැස් කරමු.

## බුදුගුණ සිහි කරමි



සංසාරයේ සැරිසරමින් නිවන සොයා
අපමණ දුකක් වින්දා අපගෙ බුදු පියා
එගොඩ කළ අය මෙතකැයි කියා
කියනට බැහැ බොහෝ දෙන නිවන් ගියා

සියලු කෙලෙස් දුරු කළ බුදු පියාණෙනි
සතර සත්‍ය දෙසූ සම්බුදු පියාණෙනි
පසළොස්වරණ ධර්ම දෙසූ බුදු පියාණෙනි
අරිඅටඟිමඟ මැනවින් දෙසූ බුදු පියාණෙනි

සියලු ලෝකයන් දත් අප බුදු පියාණෙනි
නොහික්මුණු පුරුෂයන් දමනය කළ බුදු පියාණෙනි
දෙව් මිනිසුන්ට සෙත සැලසූ බුදු පියාණෙනි
මනාව දම් දෙසූ භාග්‍යවත් බුදු පියාණෙනි

නවඅරහාදි ගුණයෙන් යුතු බුදු පියාණෙනි
සංසාරයේ සැරිසැරූ බෝ සතාණෙනි
ලෝසතුන් නිවන් මඟට ගත් බුදු පියාණෙනි
නිම කළ නොහැකි ගුණ ඇති බුදු පියාණෙනි

වෙසක් පොහෝ දින හිමි ගුණ සිහි කරමින්
ආමිස ප්‍රතිපත්ති පූජා ඉටු කරමින්
මුළු ලොවම ඒකාලෝකය කරමින්
කළගුණ ඉටුකරන්නෙමු සිත් සැදැහෙන්

*යටිවාවල - ඇටමුරුංගාගොඩ*
**චිත්‍රා කුමාරිහාමි**

## බුදු බණ පදයකට...

ලෝ සත වෙතට සදහම් මල් වැසි වැටුණා
සුර බඹ නරන් සැම ඒ වැස්සට තෙමුණා
මෙත්මල් කළඹකට තෙරුවන් ගුණ අමුණා
බුදු බණ පදයකට නතුවී හිත දැමුණා

මුදු මදනල හමා බරණැස් පුරවරට
සුදු මුදු රැස් විදා මිගදායට හොඳට
බුදු කරුණාව පාමින් ලෝ සත වෙතට
බුදු හිමි දම් දෙසයි පස්වග මහණුන්ට

ලෝ සත වෙතට සදහම් මල් වැසි වැටුණා
සුර බඹ නරන් සැම ඒ වැස්සට තෙමුණා
මෙත් මල් කළඹකට තෙරුවන් ගුණ අමුණා
බුදු බණ පදයකට නතු වී හිත දැමුණා

**කේ.එම්. නන්දවතී මැණිකේ**

# සැනසීමෙන් ජීවත් වන්න පුරුදු කළ යුතු

# සතර සංග්‍රහ වස්තු



> **“ බුදුරජාණන් වහන්සේ දේශනා කළ දෙවැනි කරුණ නම් ප්‍රිය වචනයයි. එය අප කාගේත් සිත් සතන් පිනවන්නකි. පවුලක්, රටක්, භේද භින්න වූ සමාජයක් නැවත එකමුතු කිරීමට ප්‍රිය වචනය මහත් පිටුවහලක් වේ. ප්‍රිය වචනයෙහි ඕනෑම පුද්ගලයකු දමනය කිරීමේ බලයක් ඇත. බුදුරජාණන් වහන්සේ දමනය කිරීමට අපහසු පුද්ගලයන් බොහෝ දෙනකු දමනය කළේ සුභාෂිත වචනයෙන් මෛත්‍රී සහගත වදන්වලිනි. ”**

**සමාජයේ ජීවත් වන ස්ත්‍රී - පුරුෂ, ගිහි - පැවිදි සෑම පුද්ගලයකුට ම මෙලොව ජීවිතය සැනසීමෙන් ගත කිරීමට උපකාර වන කරුණු හතරක් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.**

පළමුවැන්න දානයයි. දානය යනු දීමයි. පරිත්‍යාගය යනුවෙන් ද මෙය හැඳින්වේ. දානය යන වචනය කියත් ම අපට සිහිපත් වන්නේ ආගමික මුහුණුවරකින් කෙරෙන පින්කමක් ලෙස ය. ආමිෂ දානය, අභය දානය, ධර්ම දානය යනුවෙන් ත්‍රිවිධාකාර වේ.

ආමිෂ දානය යනු ආහාර වස්ත්‍ර ආදිය දීම ය. අභය දානය ලස සැලකෙන්නේ මරන්නට සිටි සතුන් බේරාගැනීම, කූඩුවල සිරකර සිටින සතුන් නිදහස් කිරීම, ගින්නෙන්, දියෙන්, සතුරන්ගෙන් විපත් සිදු වන්නට සිටින පුද්ගලයන් ඒවායින් බේරා ගැනීම හා ආරක්ෂා කිරීම ආදියයි.

ලාභ, කීර්ති, ප්‍රශංසා ආදිය ගැන නොතකා පින් පව් හඳුන්වා දෙමින් දහම් දෙසීම ධර්ම දානයයි. ධර්ම දේශකයාණන් වහන්සේ ලවා ධර්මය දේශනා කරවීම, බණ පොත් ලියැවීම, හා ඒවා මුද්‍රණය කර පූජා කිරීම, බණ අසන්නට අකැමැති අය ඒ සඳහා උනන්දු කරවීම, ධර්මය හදාරන අයට නොමිලයේ බණ පොත් ලබාදීම ආදී සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා කරන කටයුතු ධර්ම දානය ලෙස හැඳින්වීමට හැකි ය.

දානයන් අතුරෙන් මෙම ධර්ම දානය උසස්ම දානය වේ.

**සබ්බ දානං ධම්ම දානං ජිනාති**
**සබ්බ රසං ධම්ම රසෝ ජිනාති**
**සබ්බ රතිං ධම්ම රතී ජිනාති**
**තණ්හක්ඛයෝ සබ්බ දුක්ඛං ජිනාති**

යනුවෙන් ධර්ම දානය සියලු දානයන්ට වඩා උසස් බව බුදුරජාණන් වහන්සේ සක් දෙවිඳු ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් වදාළහ.

පාලකයා - රටවැසියාට යහපත අභිවෘද්ධිය උදාකිරීමට පන්ති භේදයකින් තොරව කරන දීමනා ද දානය ලෙස නම් කළ හැකි ය. සෞඛ්‍ය සේවා, අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම, ආහාරපාන, ඇඳුම්-පැළඳුම් සැපයීම මින් අදහස් කෙරේ. කෘෂි කර්මාන්තයට අවශ්‍ය පොහොර බීජ වර්ග සහන මිලට සපයා දීමත්, සුදුසුකම අනුව රාජ්‍ය සේවයට පුද්ගලයන් බඳවා ගැනීමත් රජය මඟින් කළ යුතු මා හැඟි දානයි.

මිනිසාගේ මූලික අවශ්‍යතා වශයෙන් සැලකෙන්නේ ආහාර, නිවාස, ඇඳුම් - පැළඳුම්, බෙහෙත් ආදියයි. මිනිසා දිවා රෑ වෙහෙසෙන්නේ ද මේවා සපුරා ගැනීමටයි. එනිසා රට පාලනය කරන්නන් මේ පිළිබඳ ඉතා අවධානයෙන් කටයුතු කිරීම මහඟු දානමය පින්කමකි.

අලෝභ, අදෝෂ, අමෝහ යන හේතුවලින් යුක්ත ඒ මසුරුමල සෝදාහරිමින් දානයක් පිළියෙල කරන අවස්ථාවේ, ආරම්භයේ සිටම සතුටු සිතින් එය කිරීමත්, දීමෙන් සිත පහදවා ගැනීමත්, ඉන් පසුව ද තමා දුන් දානය ගැන සිතමින් සතුටු සිත් ඇති කර ගැනීමත් කළ යුතු ය. ඉන් ලැබෙන ඵලය අති මහත් ය. වස්තුව ලැබීම, සෑම කෙනකුම ඔහුගේ ආශ්‍රය ප්‍රිය කිරීම, කීර්තියට පත්වීම, සතුටු සිතින් ජීවත් වීම, මිතුරන් ඇතිවීම සහ මරණින් මතු සුගතියෙහි ඉපදීම දානයේ ආනිශංසයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ දෙවැනි කරුණ නම් ප්‍රිය වචනයයි. එය අප කාගේත් සිත් සතන් පිනවන්නකි. පවුලක්, රටක්, භේද භින්න වූ සමාජයක් නැවත එකමුතු කිරීමට ප්‍රිය වචනය මහත් පිටුවහලක් වේ. ප්‍රිය වචනයෙහි ඕනෑම පුද්ගලයකු දමනය කිරීමේ බලයක් ඇත. බුදුරජාණන් වහන්සේ දමනය කිරීමට අපහසු පුද්ගලයන් බොහෝ දෙනකු දමනය කළේ සුභාෂිත වචනයෙන් මෛත්‍රී සහගත වදන්වලිනි.

වචනය දෙපැත්ත කැපෙන ආයුධයක් මෙනි. එහි හොඳ පැත්තක් හා නරක පැත්තක් ඇත. සුමුදු ප්‍රිය ජනක මටසිලිටි වචන කතා කිරීම හොඳ පැත්ත ය. ඉන් අසන්නාගේ සිත තෘප්තිමත් වේ. සුහදත්වය ගොඩනැඟේ. මංගල සූත්‍රයේ 'සුභාෂිතාච යාවාචා' යැයි පෙන්වා වදාළේ එයයි. එමෙන්ම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වාචා යනුවෙන් ද දක්වා ඇත්තේ මෙයයි.

නරක පැත්තෙන් කෙරෙනුයේ මුසාවාද, පිසුනාවාචා, පරුෂාවාචා වැනි දේ කීමෙන් මිනිසුන් භේද භින්න කිරීමයි. සිත් තැවුල් ඇතිවීම හා සතුරන් ඇති කර ගැනීමයි. අහිංසක නමැති දක්ෂ ප්‍රියමනාප පුද්ගලයා අංගුලි මාල බවට පත් කළේ සිදු නොවූ දෙයක් වාර්තා කිරීමෙනි.

බුදුරජාණන් වහන්සේ දේශනා කළේ තමා කතා කරන දෑ ප්‍රිය වන්නට නම් අන්‍යයන්ට මිහිරි වීම හා ප්‍රිය වීම, කතා කරන දෑ නිතරම සත්‍ය වීම, අනුන් කෙරෙහි මෙත් සිතින් කතා කිරීම, සුදුසු අවස්ථාවේ දී පමණක් කතා කිරීම, සුදුසු බවයි. කරුණා පෙරදැරිව මෙත් සිතින් ප්‍රිය වචන කතා කරනු ඇසීමට සතුන් වුවත් ආශා කරන බව නන්දි විසාල ජාතකයෙන් පැහැදිලි වේ.

අර්ථචර්යාව දියුණුවේ තුන්වැනි මඟයි. එය පරාර්ථය සඳහාම විය යුතු ය. පාලකයා විසින් තමාගේ බුද්ධිය හා ශක්තිය යොදවා රටවැසියාගේ දියුණුවට හේතුවන කරුණු සිදු කරවිය යුතු ය. එය ඔහුගේ පරම යුතුකම වෙයි. වැරැදි මඟෙහි ගිය පුද්ගලයන් සුමගට ගැනීම උතුම් සත්පුරුෂ ගුණයකි. එමෙන්ම නැති බැරි කෙනකු හමු වූ විට ඔහුගේ තරාතිරම නොබලා පිහිට වීමට ඉදිරිපත් වන පුද්ගලයා ද උතුම් කෙනෙකි. හැකි සෑම අවස්ථාවක දී ම කෙනෙකුට දියුණුවීමේ මාර්ගය කියා දීමත් අගනා ගුණයකි. පුද්ගලයාගේත් සමාජයේත් අභිවෘද්ධිය තකා කටයුතු කිරීම මින් අදහස් කෙරේ.

ජාතිය, ආගම, කුලය, වර්ණය, භාෂාව ගැන තැකීමක් නොකොට සියලු දෙනාට ම සමානව කටයුතු කිරීම සමානාත්මතාවයි. එය මෙලොව ජීවිතය සරු කරන සතර වන කරුණයි. බොහෝ දෙනා බාහිර පෙනුම, උගත්කම, රැකියාව අනුව වෙනස් ක්‍රමවලට සැලකීමට පුරුදුව සිටිති. එය සමාජ සංවර්ධනයට බාධාවකි. බුදුරජාණන් වහන්සේ වැඩසිටි සමයේ විසූ බමුණන් අතර මේ කුල භේදය උග්‍ර ලෙස තිබිණි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යනුවෙන් මිනිසුන් කොටස් කර තිබිණි. බ්‍රාහ්මණයින් උසස් පුද්ගලයන් ලෙස සැලකූ අතර ශුද්‍ර ඉතා පහත් කුලය ලෙස හැඳින්විණි. ශුද්‍ර කුලයේ අය මුණ ගැසීමත් ඉතා අසුබ දර්ශනයක් සේ සැලකූහ.

අග්ගික භාරද්වාජ බමුණා තමන් වහන්සේට වසලයා යන්නෙන් ආමන්ත්‍රණය කළ විට වසලයා යනු කවරෙක් දැයි පහදා දුනි.

**න ජච්චා වසලෝ හෝති**
**න ජච්චා හෝති බ්‍රාහ්මණෝ**
**කම්මනා වසලෝ හෝති**
**කම්මනා හෝති බ්‍රාහ්මණෝ**

යනුවෙන් කෙනකු වසලයකු හෝ බ්‍රාහ්මණයකු වන්නේ උපතින් නොවේ. ඔවුන් කරන ක්‍රියා නිසා වසලයකු වන බවත් පිරිසුදු ක්‍රියා කිරීමෙන් බ්‍රාහ්මණයකු වන බවත් වදාරමින් බුදුරජාණන් වහන්සේ වසල සූත්‍රය දේශනා කළ සේක.

තමන් ඉදිරියට වඩිනා බුදුරජාණන් වහන්සේ සැඩොල් කුලයේ උපන් සුනීත තමා ගෙන යන අසුචි කද පසෙක තබා කාණුවට බැස්සේ තමන් මුණගැසීම දෝෂාරෝපණයට කරුණක් වන හෙයිනි. බියෙනි. එහෙත් අප මහා කාරුණිකයාණන් වහන්සේ සුනීත දෙස කරුණාවෙන් බලා “පුත සුනීත ඔබ මහණ වන්නට කැමැති දැයි ඇසුවේ කුල භේදය පිටුදකිමිනි.”

උන්වහන්සේ කුල භේදය නොසලකා රජ නිවසටත්, බමුණු නිවසටත් පිඬු සිඟා වැඩියහ. උපතිස්ස, කෝලිත බමුණු තරුණයන් දෙදෙනාට මෙන්ම උපාලි කරණවෑමි තරුණයාටත් එක සේ සැලකූහ. ඔවුහු බුදු සසුනේ තනතුරු ලැබුවේ කුල භේදයෙන් තොරව ය.

බුද්ධ කාලයේ කාන්තාවට ද හිමිව තිබුණේ පහත් තත්ත්වයකි. පවුලක ගැහැනු දරුවකු ඉපදීම පවා අසුබ දෙයක් ලෙස සැලකිණි. දිනක් කොසොල් රජතුමා බුදුන් වහන්සේ සමීපයෙහි සිටියදී පණිවිඩකරුවකු රජතුමාට දැන්වූයේ දේවියට දියණියක ලැබුණු බව ය. මෙයින් කොසොල් රජතුමා අසතුටට පත්වී සිටින ආකාරය දුටු බුදුන් වහන්සේ කාන්තාවකගේ අති උතුම් බව වටහා දුන්හ. පුරුෂයාට මෙන්ම කාන්තාවට එක හා සමාන අයිතීන් තිබිය යුතු බව වදාළහ. බුදුදහම නිසා කාන්තාවට ද උසස් තත්ත්වයක් ලැබිණි. නිවන පසක් කර ගැනීමේ භාග්‍යය ද උදාවිය.

සෑම මනුෂ්‍යයකුට ම තම අයිතීන් හා හිමිකම් ඇත. ඒ අනුව සැමට නිදහසේ සිතීමට, ක්‍රියා කිරීමට ආගමක් ඇදහීමට නිදහස තිබිය යුතු ය. එයට බුදු දහම මඟින් ඉඩ සලසා දී ඇත.

සතර සංග්‍රහ වස්තු වශයෙන් දේශනා කළ කරුණු සතර මෙලොව ජීවිතය වාසනාවන්ත කර ගැනීමටත්, පරලොව සුගතියෙහි ඉපදීමටත් හේතුවන බව බුද්ධ දේශනාවයි.

අයන්ති විතාන



# ධර්ම ශ්‍රවණයේ දී මොහොතකදු සාධුකාර දුන්නත් අනුසස් අපමණයි

**බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටි සමයේ බොහෝ පින් කරන සුන්දර තරුණයෙක් ඒ නුවර වාසය කළා. ඔහුගේ කායික පෙනුම තරුණියන්ගේ සිත් ඇදගත්තා. වචනය ඉතා මිහිරියි. මේ නිසා ම ඔවුන්ගේ යෙහෙළියන් හා මිතුරන් වෙතින් ඔහුට නිතර විවාහ යෝජනා ලැබෙන්න පටන් ගත්තා.**

දිනක් එක් යෝජනාවකට ඔහු කැමැත්ත පළ කළා. ඒ තරුණිය මුලු සැවැත්නුවර ම සිටි ලස්සන ම තරුණියයි. ඇය උගත්කමින්, කුලගොත්වලින්, වස්තු සම්පත්වලින් සහ යහපත් ගුණ ධර්මවලින් පිරී තිබුණා.

දෙදෙනාගේ විවාහ යෝජනාව මව්පියන්ගේ මැදිහත්වීම මත සිදු කළා. විශාල මන්දිරයක පදිංචි වී දෙදෙනා ආදරයෙන් සහ සතුටින් කාලය ගත කරන්න පටන් ගත්තා.

බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනාවල කීර්ති රාවය සැවැත්නුවර පුරා නිතර පැතිරෙමින් තිබුණා. බොහෝ පිරිස් උන්වහන්සේ වෙත එළඹ දහම් ශ්‍රවණය කරන බව තරුණයාටත් දැනගන්න ලැබුණා. බිරිඳත් කැඳවාගෙන ධර්මය ඇසීමට යන්න සිත් වුණා. එහෙත් බිරිඳ නම් එයට කැමැති වුණේ නෑ. කෙසේ හෝ සැමියා කෙරෙහි අනුකම්පාවෙන් දිනක් බණ ඇසීමට විහාරයට ගියා. දෙදෙනාම ධර්මය ශ්‍රවණය කළා.

තරුණයාගේ සිතට පුදුම ශාන්තියක්, සතුටක් ගෙන දුන්නා. දෙවැනි දිනත් ධර්මය ඇසීමට ගියා. මෙසේ ක්‍රමයෙන් දින, සති, මාස ගෙවමින් කාලය ගත වුණා. තරුණයාගේ ධර්ම ඥානය වර්ධනය වුණා. ගිහි ජීවිතය, කම්සැප, වස්තු සම්පත් සියල්ල එපා වුණා. ඒවාට ආශාව නැති වුණා.

දිනක් බිරිඳ අමතා සොඳුර, මේ ජීවිතය දුක්ඛිතයි, සැපයක් කියා දෙයක් නෑ. සැප යැයි සිතන දේවල තියෙන්නේ විදුලි සෙනක් වැනි ඉතාම කෙටි වින්දනයක් විතරයි. ඒ නිසා මේ දුක්ඛිත ජීවිතයෙන් ඉක්මනින්ම මිදිය යුතුයි. අපි දෙන්නාත් පැවිදි වෙමු'යි යෝජනා කළා. එහෙත් බිරිඳ එයට කැමැති වුණේ නෑ.

තරුණයා පැවිදි වීමට අවසර ඉල්ලා සිටියා. එයටත් ඇය අකැමැති වුණා. තරුණයාගේ පැවිදිවීමේ සිතිවිල්ලෙහි ද වෙනසක් වුණේ ම නෑ. නිතර නිතර අවසර ඉල්ලුවා. ඒ නිසා තරුණයාගේ සතුට වෙනුවෙන් පැවිදිවීමට ඇය අවසර ලබා දුන්නා. සතුටින් පිරී ඉතිරී ගිය තරුණයා එදිනම එක්තරා පිණ්ඩපාතික තෙරුන් වහන්සේ නමක් වෙත එළැඹ පැවිදි බිමට පත් වුණා. භාවනා කමටහන් ගෙන භාවනා කටයුතු දිගටම කරගෙන යන්න පටන් ගත්තා.

සැවැත් නුවරෙහි ම සිටි ලස්සනම තරුණියගේ ස්වාමි පුරුෂයා පැවිදි වුණු බවත්, ඇය තනි වුණ බවත් යන පුවත ඉක්මනින් නුවර පුරා පැතිර ගියා. පසේනදී කොසොල් රජතුමාටත් මේ ආරංචිය දැන ගන්න ලැබුණා.

රජතුමා මෙහෙම කල්පනා කළා. "සැමියා නැති බිරිඳ අයිති රටේ රජතුමාට යි, ඇය රූපයෙන් ද අගතැන්පත්. එබැවින් ඇය මාගේ අන්තඃපුරයට ගෙන ආ යුතුයි සිතා රාජ පුරුෂයන් යවා ගෙන්වා ගත්තා.

දිනක් රජතුමා අන්තඃපුරයට පිවිස බිරින්දෑවරු සතුටු කිරීමට මානෙල් මල බැගින් ලබා දුන්නා. ස්වාමි පුරුෂයා පැවිදි බිමට පත් නිසා අන්තඃපුරයට පැමිණි බිරිඳට රජතුමා වෙතින් මහනෙල් මල් දෙකක් ම හිමි වී තිබුණා. ඇය ඒවායෙහි සුවඳ බල බලා සිපගනිමින් පසෙකට වී හඬන්න පටන් ගත්තා. රජතුමා ඇගේ හැඬීම අසා ඇය තමා සමීපයට ගෙන්වා එයට හේතුව කුමක් දැයි ප්‍රශ්න කළා. එවිට ඇය රජතුමා අමතමින්

"ස්වාමිනි, මාගේ සැමියාගේ මුවින් විහිදෙන සුවඳ මානෙල් මල් සුවඳ වගෙයි. ඔහු මතක් වී ඇඬුණායි කියා සිටියා. රජතුමා මෙය කොහෙත් ම විශ්වාස කළේ නෑ. ඒ නිසා නැවත නැවතත් කරුණු විමසා සිටියා. ඒ හැම අවස්ථාවක දී ම ඇය කියා සිටියේ තම සැමියාගේ මුවෙන් හමන සුවඳ මහනෙල් මල් සුවඳට සමාන බැවින් ඔහු සිහිපත් වී ඇඬූ බවයි.

මේ නිසාම රජතුමා ඒ ගැන සොයා විමසා බැලීමට තීරණය කළා. පසුදා උදෑසනම ජේතවනාරාමයට ගොස් බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට පසුදින රාජ මාලිගයේ දානයට වඩින ලෙස ආරාධනා කළා. බුදුරජාණන් වහන්සේත් ආරාධනාව පිළිගෙන පසු දින රජතුමාගේ මාලිගයට වැඩම කළා.

එදින රජතුමා මාලිගයේ තිබුණ සුවඳ විලවුන් සියල්ලම මාලිගයෙන් ඉවත් කළා. සුවඳ හමන්නේ යැයි සලකන කිසිදු දෙයක් තියා ගැනීම තහනම් කළා. බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ වැඩම කොට දානය වළඳා අවසන් වුණා.

ඒ සියල්ල අවසානයේ දී මහනෙල් මල් දෙකක් හිමි වුණු එම බිරිඳ අමතා තමන්ගේ පුරාණ සැමියා කවර භික්ෂුවක් දැයි විමසා දැනගත්තා. බුදුරජාණන් වහන්සේ වෙත එළඹ

"ස්වාමිනි, මාගේ එක් ආශාවක් අද දිනට යෙදී තිබෙනවා. එය ඉටු කරදෙන සේක්වායි පවසමින් අදාළ භික්ෂුව පෙන්වා උන්වහන්සේ වෙතින් අනුමෝදනා බණ ඇසීමට කැමැති බවත්, බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ සෙසු සංඝයා වහන්සේ විහාරයට වැඩම කරන ලෙසත් පවසමින් තම ඉල්ලීම කියා සිටියා.


බුදුරජාණන් වහන්සේත් රජතුමාගේ බලාපොරොත්තුව ඒ ආකාරයෙන් ම ඉටු කිරීමට අවශ්‍ය කටයුතු සකසා දුන්නා. රජතුමා අදාළ භික්ෂුන් වහන්සේ වෙත එළඹ "ස්වාමිනි, අප කෙරෙහි අනුකම්පාවෙන් ධර්මය දේශනා කරන්න" යි. ආරාධනා කළා.

ඒ භික්ෂුව ධර්ම දේශනාවට මුව විවර කරද්දීම ධර්ම ශ්‍රවණයට සකසා තිබුණු ශාලාවේ පටන් ක්‍රමයෙන් රාජ මාලිගය ම මහනෙල් මල් සුවඳින් පිරී ඉතිරී යන්න පටන් ගත්තා. රජතුමාට අදහා ගන්න බැරි වුණා. සෙසු අන්තඃපුර ස්ත්‍රීන්, රාජ පුරුෂයන් සහ රාජ්‍ය නිලධාරීන් ද සෙසු ජනයා ද පුදුමයට පත් වුණා. රජතුමා තෙරුන් වහන්සේගේ ධර්ම දේශනයෙන් පසු උන්වහන්සේ විහාරයට වැඩමකරවීමට සැලැස්වූවා.

පසුව සවස් යාමයේ බුදුරජාණන් වහන්සේ වෙත එළඹ "ස්වාමිනි, අද දින අනුමෝදනා ධර්ම දේශනාව පැවැත් වූ තෙරුන් වහන්සේගේ මුවින් මහනෙල් මල් සුවඳ පැතිර ගියා. රාජමාලිගය ම ඒ සුවඳින් සුවඳවත් වුණා. ස්වාමිනි, ඒ කවර පුණ්‍ය මහිමයක් නිසා ලැබූ භාග්‍යයක් දැයි විමසා සිටියා.

"රජතුමනි, ඒ භික්ෂුව පෙර ආත්මවල ධර්මය ශ්‍රවණය කරමින් ප්‍රීතියෙන් සාධුකාර දී තිබෙනවා. ඒ පින විපාක දීමක් වශයෙන් දැන් මුවින් මහනෙල් මල් සුවඳ හමනවා"යි දේශනා කළා.

ධර්ම දේශනා පවත්වන අවස්ථාවල දී, මොහොතකුදු සාධුකාර දීම් සිදු කරන්නේ නම් ඔහුට හෝ ඇයට නොයෙක් අනුසස් ලැබෙන බවත්, එයට හේතුව ධර්මය ස්වාක්ඛාතවීම බවත් පවසමින් බුදුරජාණන් වහන්සේ තවදුරටත් රජතුමාට ධර්ම කරුණු පහදා දුන්නා.



✍ නයනා නිල්මිණී

## පිනක විපාකය බලවත් වූ හැටි

පින්වත් දෙව්දුව, ඔබේ මේ ඇත් වාහනය උත්තම එකක්. නොයෙක් මැණික්වලින් මේ ඇතා සරසලයි තියෙන්නේ. හරිම සිත්කලුයි. ශක්ති සම්පන්නයි. වේගවත් ගමනක් තියෙන්නේ. අහසින් ගමන් කරන්නේ.

පින්වත් දෙව්දුව, ඔබේ ඇස් පවා නෙළුම්පෙති වගේ. මේ ඇතා බබළන්නෙත් නෙළුම් මහනෙල් පාටිනුයි. නෙළුම් රේණුවලින් මේ ඇතාගේ ඇඟ වැහෙනතුරුම සැරසිලා තියෙනවා. රනින් කළ නෙළුම් මල් මාලාවක් මේ ඇතා පැළඳගෙන ඉන්නවා. මේ ඇතා ගමන් කරන්නේ නෙළුම් පිරුණු මාවතක. ඒ නෙළුම් පත්වලින් මේ මාවත බබළනවා. සුන්දර විදිහට මේ ඇතා පා තබමින් යන හැටි හරිම අපූරුයි. ඒ ඇත් වාහනය ගමන් කරද්දී මිහිරි නාදය පැතිරෙනවා. රනින් කළ සීනුවලිනුයි ඒ නාදය පැතිරෙන්නේ. පංචාංගික තූර්ය නාදය වගේම එය සුන්දරයි. මේ ඇත් රජාගේ පිට උඩ ඉන්න ඔබ දිව්‍ය සළුපිළිවලින් ලස්සනට සැරසිලයි ඉන්නේ. ඔබව පිරිවරාගත් අනෙක් දිව්‍ය අප්සරාවන්ටත් වඩා සුන්දරත්වයෙන් බබළන්නේ ඔබම යි. ඔබ මේ පුණ්‍ය විපාකය ලැබුවේ දානයක් පූජා කරලා ද? එහෙම නැත්නම් උතුම් සීලයක් රැකලා ද? ඒ දෙවඟනගෙන් මොග්ගල්ලාන මහ රහතන් වහන්සේ'යි මෙලෙස ඇසුවේ.

ඒ ගැන අහල දෙව්දුව ගොඩාක් සතුටු වුණා. මොන වගේ පින්කම්වලින් ද මේ සැප ලැබුණේ කියලා මෙසේ කිව්වා.

දිනක් මම සත්පුරුෂයන් වහන්සේ නමක් දුටුවා. උන්වහන්සේ ගුණ සම්පන්නයි. ධ්‍යාන වඩනවා. ධ්‍යානයෙහි ඇලී වාසය කරනවා. ඉතිං මම ලස්සනට මල් අතුරලා අලුත් පිරුවටයකින් සරසලා ආසනයක් පිළියෙළ කරලා උන්වහන්සේට පූජා කළා.

ආසනය වටේ බිම ලස්සනට නෙළුම් මල් මාලාවන් තැන්පත් කළා. නෙළුම් මල් පෙති ලස්සනට විසුරුවා දැනුමෙන් මේ දැතින්මයි. ඒ කුසල කර්මයේ විපාක වශයෙන් තමා මෙවැනි සම්පත් ලැබුණේ.

ඇත්තෙන් ම අවබෝධයෙන් ම, කෙලෙසුන්ගෙන් නිදහස් වුණ ශාන්ත ජීවිත ඇති බ්‍රහ්මචාරීන් වහන්සේලා කෙරෙහි හිත පහදවා ගන්නවා නම්, ආසනයක් පූජා කර ගන්නවා නම් එබඳු කෙනකුට මම වගේම දිව්‍ය සම්පත් ලබාගෙන සතුටු වෙන්න පුළුවනි. අන්න ඒ නිසා තමාගේ යහපත කැමති, පුණ්‍ය විපාක ලබන්න මහත් ආශා ඇති කෙනා අවසන් දේහ දරා වැඩ සිටින ඒ රහතන් වහන්සේට ආසනයක්මයි පූජා කර ගන්න ඕන.

***ඛුද්දක නිකාය විමාන වත්ථු***
***කුඤ්ජර***
***විමාන වත්ථු ඇසුරෙනි***

# රෑ දුම් දමන දහවල ඇවිළෙන තුඹසේ කතාව

**බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් විහාරයේ වැඩ සිටි කාලයේ දී අන්ධ වනයේ වැඩ සිටි කුමාර කස්සප තෙරුන් වහන්සේ හමුවීමට පැමිණි දෙවි කෙනෙක් පිළිබඳ කතා පුවතක් මජ්ඣිම නිකායේ වම්මික සූත්‍රයේ සඳහන් වෙනවා.**



තමන්ට පැමිණි එක්තරා ගැටලුවක් නිරාකරණය කර ගැනීමේ අදහසින් මධ්‍යම රාත්‍රියේ දී කුමාර කාශ්‍යප තෙරුන් වෙත පැමිණි එම දේවතාවා කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ ඉදිරියේ එකත්පස්ව සිටිමින් මේ ආකාරයෙන් කරුණු විමසා සිටියා.

“ස්වාමීනී මේ තුඹස රෑ දුම් දමයි. දවල් ඇවිළෙයි” මෙසේ කීවිට බ්‍රාහ්මණයෙක් සුමේධය,අවියකින් සාරව යි කීය.

සුමේධ ආයුධයකින් සාරයි. හේ දොර අගුලක් දැක දොර අගුලකැ යි කිය යි.

බමුණා දොර අගුල ඉවත දමා,අවිය ගෙන නැවත සෑරීමට කියයි. “සුමේධ සාරයි. පිම්බෙන මැඩියෙකැ”යි කියයි. මැඩියා ඉවත ලා නැවත සෑරීමට බමුණා කියයි.

සුමේධ එසේ කරයි. දෙමංසන්ධියෙකැ යි කියයි. දෙමංසන්ධිය අස්කර නැවත සෑරීමට බමුණා කියයි. සුමේධ එසේ කර අළු පෙරහනක් දැක ඒ බව දන්වයි. අළු පෙරහන ද ඉවත්කර නැවත සෑරීමට බමුණා උපදෙස් දෙයි. සුමේධ නැවත සාරන්නේ ඉදිබුවකු දැක “ඉදිබුවෙකැ” යි කියයි. බමුණා ඉදිබුවා ඉවත්කර නැවත සෑරීමට කියයි. සුමේධ නැවත සාරන්නේ මස් කපන කැත්තක් හා මස් ලොඹුවක් දැක ඒ බව දන්වයි.

ඒවා ඉවත් කර නැවත සෑරීමට බමුණා නියම කරයි. නැවත සාරන සුමේධ මස් වැදැල්ලක් දැක ඒ බව දන්වයි. බමුණා මස් වැදැල්ල ඉවත්කොට ඉදිරියට සෑරීමට කියයි.

සුමේධ එසේ සාරන්නේ නාගයකු දැක “නාගයෙකැයි” කියයි

“නාගයා සිටීවා, නාගයාට හිරිහැර නොකරව, නාගයාට නමස්කාර කරව“ යි බමුණා කියයි.

මේ ආකාරයෙන් කුමාර කාශ්‍යප තෙරුන්ගෙන් විමසූ කරුණු බුදුරජාණන් වහන්සේට දන්වන ලෙසත් එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ පිළිබඳ ලබා දෙන පිළිතුර මතක තබා ගන්නා ලෙසත් කුමාර කාශ්‍යප තෙරුන්ගෙන් ඉල්ලීමක් කළ දේවතාවා තවදුරටත් ප්‍රකාශ කර සිටියේ ස්වාමීනී ,තථාගතයන් වහන්සේගෙන් හෝ තථාගත ශ්‍රාවකයකුගෙන් හෝ මේ සසුනෙන් අසා දැන පවසන්නකු හෝ හැර මුළු සදේවක ලෝකයෙහි මේවා විසඳීමට සමතෙක් ඇතැයි මම නොසිතමි යි යනාදී වශයෙන් ප්‍රකාශ කරන්නට යෙදුණා.

දිව්‍ය පුත්‍රයාගේ ඉල්ලීම පරිදි කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ ද බුදුරජාණන් වහන්සේ වෙත වැඩම කරමින් දිව්‍ය පුත්‍රයා අසා සිටි ප්‍රශ්න එකින් එක නිරාකරණය කර ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේට ඉදිරිපත් කරන්නට වුණා.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස තුඹස නම් කුමක්ද? රෑ දුම් දැමීම නම් කුමක් ද? දහවල් ඇවිළීම නම් කුමක්ද? බමුණා නම් කවරෙක් ද? සුමේධ නම් කවරෙක් ද? ආයුධ නම් කවරෙක් ද? සෑරීම නම් කුමක් ද? දොර අගුල කුමක්ද? මැඩියා කවරෙක් ද? දෙමංසන්ධිය කුමක් ද? අළු පෙරහන කුමක් ද? ඉදිබුවා නම් කවරෙක් ද? මස්කපන කැත්ත හා මස් ලොඹුව නම් කුමක් ද? මස් වැදැල්ල නම් කුමක් ද? නාග රාජයා නම් කවරෙක් ද?

> **“මහණ, තුඹස යනු මව්පියන්ගෙන් හටගත්, කෑම්බීම්වලින් වැඩුණා වූ , නිත්‍ය නොවන්නා වූ, සුවඳ ගැල්වීම්, ඉලීම්, පිරිමැදීම් ආදියෙන් පෝෂණය කළ යුතු වූ, කැඩෙන, බිඳෙන, වැනසෙන ස්වභාවය ඇත්තා වූ සතර මහා භූතයන්ගෙන් හට ගත්තා වූ ශරීරයට කියන නමෙකි.”**

ඒ ආකාරයෙන් බුදුරජාණන් වහන්සේ වෙත ඉදිරිපත් කළ එම ප්‍රශ්න කුමාර කාශ්‍යප තෙරුන්හට භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කර දෙමින් වදාරනු ලැබුවේ

මහණ, තුඹස යනු මව්පියන්ගෙන් හටගත්, කෑම්බීම්වලින් වැඩුණා වූ ,නිත්‍ය නොවන්නා වූ, සුවඳ ගැල්වීම්, ඉලීම්, පිරිමැදීම් ආදියෙන් පෝෂණය කළ යුතු වූ කැඩෙන, බිඳෙන, වැනසෙන ස්වභාවය ඇත්තා වූ සතර මහා භූතයන්ගෙන් හට ගත්තා වූ ශරීරයට කියන නමෙකි.

රාත්‍රියෙහි දුම් දැමීම නම් දවල් කළ යුතු වැඩ ගැන රෑ කල්පනා කරමින් සිටීමයි. රෑ කල්පනා කරමින් සිටි දේවල් දවල් කාලයෙහි කයින් හෝ වචනයෙන් හෝ මනසින් හෝ ක්‍රියාත්මක කිරීම දවල් ඇවිළීම නම් වේ.

බ්‍රාහ්මණයා නම් තථාගතයන් වහන්සේට නමෙකි. සුමේධ යනු යක්ෂයාට නමෙකි. ආයුධය යනු ආර්යයන්ගේ ප්‍රඥව ය. වීර්යවන්තව ක්‍රියා කිරීම සෑරීමයි.

දොර අගුල යනු අවිද්‍යාවයි. ආයුධය නම් ආර්යයන්ගේ ප්‍රඥවයි. මෙහෙදී ආර්ය මාර්ගය නමැති ආයුධය ගෙන වීර්යයෙන් අවිද්‍යාව ඉවත් කරව යන්න ආයුධයෙන් සාරා දොර අගුල ගලවා දමන්නැයි කීමෙන් අදහස් කරන ලදී.

පිම්බෙන මැඩියා නම් බලවත් ක්‍රෝධයයි. සුමේධය මැඩියා ඉවත් කරවයි යන්නෙන් ආර්ය මාර්ග ඥණයෙන් බලවත් ක්‍රෝධය නැතිකරව යනු අදහස් කෙරේ.

දෙමංසන්ධිය නම් විචිකිච්ඡාවයි. සුමේධය ආයුධයෙන් සාරා දෙමංසන්ධිය උපුටා දමන්නැයි යනු මාර්ග ප්‍රඥවෙන් විචිකිච්ඡාව නැසිය යුතු බව පැවසූ අන්දමයි.

අළු පෙරහන ඉවත ලනු යනු කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථිනමිද්ධ, උද්දච්ච, කුක්කුච්ඡ, විචිකිච්ඡා දුරු කරන්න යන්නයි.

රූප ,වේදනා,සඤ්ඤ ,සංඛාර,විඤ්ඤණ යනු උපාදාන ස්කන්ධ පස ඉදිබුවා යන්නෙන් අදහස් කෙරේ. ඉදිබුවා ඉවත් කරවයි කීමෙන් ආර්ය මාර්ගයෙන් පංචස්කන්ධය නැති කරව යන්න ඉගැන්වේ.

මස් කපන කැත්ත හා මස් ලොඹුව යන්නෙන් පංච කාමය දැක්වේ. ඇසින් දත යුතු වූ, ඉෂ්ට වූ, කාන්ත වූ, මනාප වූ, ප්‍රිය වූ, රූපය, කනින් ඇසිය යුතු එසේ ම ඉෂ්ට වූ ශබ්දය, නැහැයෙන් දත යුතු වූ ඉෂ්ට වූ ගන්ධය, දිවෙන් දත යුතු එසේම වූ රසය, කයින් විඳිය යුතු වූ එසේ එසේම වූ පහසය යන පස්කම් ගුණ නිරූපණය වේ. මස් කපන කැත්ත හා මස් ලොඹුව ඔසවාලව යන්නෙන් පංච කාම ගුණය දුරු කරව යන අදහස් කරයි.

මස් වැදැල්ල යනු නන්දි රාගයට නමකි. මස් වැදැල්ල ඉවත ලෑම නම් නන්දි රාගය දුරු කිරීමයි.

නාගරාජයා යනු නිකෙලෙස් වූ රහතන් වහන්සේ ය. නාගයා සිටීවා. නාගයා නොගසව, නාගයාට නමස්කාර කරව යනු රහතන් වහන්සේට නමස්කාර කරව යනුයි.

ඉහත සඳහන් ආකාරයට දෙවි කෙනකු විසින් කුමාර කස්සප තෙරුන් මාර්ගයෙන් බුදුරජාණන් වහන්සේගෙන් අසා පැහැදිලි කර ගත් බුද්ධ දේශනාවට කුමාර කස්සප තෙරුන් වහන්සේ බොහෝ සේ සතුටට පත් වුණා. භාග්‍යවතුන් වහන්සේ කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේට දේශනා කළ මෙම ධර්ම කාරණා මජ්ඣිම නිකායේ ඇතුළත් වම්මික සූත්‍රය තුළ අන්තර්ගත වෙනවා.

සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ සිංහල මැදුම් සඟිය ඇසුරිනි.

**හේමමාලා රන්දුනු**

# උත්සාහයේ වටිනාකම

සැදැහැයෙන් පැවිදි වී මහණ දම් පිරූ සංඝයා වහන්සේ දෙනමක් සැවැත්නුවර වාසය කළහ.මේ දෙදෙනා වහන්සේ ඉතාම හොඳ මිතුරෝ ය. දිනක් මේ භික්ෂු දෙනම බුදුරජාණන් වහන්සේ වෙත ගොස් සිත වැඩීමට සුදුසු භාවනා පිළිවෙත විමසා සිටියහ.

බුදුරදුන් වෙතින් කමටහන් ලබා ගත් දෙදෙනා වහන්සේ වස් කාලය පුරා භාවනානුයෝගීව වැඩ වාසය කිරීම සඳහා ඈත කැලෑවක පිහිටි පන්සලකට වැඩම කළහ.

මේ දෙනමගෙන් එක් භික්ෂු නමක් එහි ගොසින් ආරණ්‍යයට වැඩි අරමුණ අමතකව වියළී ගිය දඬුපත්, කොළ ආදිය එකතු කර ගිනි අවුළුවා වන අරණ බොහෝ ශීත යැයි පවසා බොහෝ වේලාවක් ගිනිතපියි. පසුව පන්සලේ වැඩ වාසය කරන පොඩි හාමුදුරුවරුන් සමඟ ආගිය තොරතුරු නිසරු දෙතිස් කතා යනාදිය පවසමින් කාලය ගෙවති.

වනයට වැඩම කළේ භාවනා වඩමින් මගඵල දොර විවර කර ගැනීමට යැයි අමතක වූ ඒ භික්ෂූන් වහන්සේ ගිනි තපිමින් හා සාමණේර හිමිවරුන් සමඟ අල්ලාප සල්ලාපයේ යෙදෙමින් කල් හරිති.

මේ හාමුදුරුවන් සමඟ වැඩි අනෙක් හාමුදුරුවෝ බුදුරදුන් වෙතින් ලබා ගත් කමටහනේ සිත යෙදා බලවත් උත්සාහයෙන්, වීර්යයෙන් යුතුව භාවනා වඩා රහත්ඵල අවබෝධයට සමත්වූහ.

තම යහළු භික්ෂුවගේ කුසීත අලස ගති ද සම්ප්‍රප්පඵලාපයෙන් කාලය ගෙවෙන හැටි ද දැක අනුකම්පාවෙන් යුතුව භාවනාවේ පමා නොවන්නැයි ඒ භික්ෂුවට කොතෙක් අවවාද කළ ද ඒ කිසිවක් නොඇසූ සේ සිටි අලස භික්ෂුව තමන් වහන්සේ තුළ වූ කම්මැලිකම් නිසාම කිසිදු ධ්‍යාන සමාපත්තියකට, මඟපල අවබෝධයකට නො පැමිණියේ ය.

එහෙත් දෙදෙනා වහන්සේ පෙර සේම මිතුදමින් යුතුව සමගියෙන් කල්ගත කළහ. වස්සමය අවසානයේ දී මේ දෙනම දෙව්රම් වෙහෙරට වැඩියහ.

බුදුරදුහු කමටහන් ලබා වනයට වැඩි මේ භික්ෂු දෙනම දැක ආගිය තොරතුරු, සුවදුක් විමසා එක් භික්ෂුවක් උත්සාහයෙන් යුතුව වෙර වීරිය වඩා භාවනාවේ නියැළීමෙන් නිවන් අවබෝධය ලද බවත්, අනෙක් භික්ෂුව අලසකමින් පමාවී භාවනාවේ සිත නොයොදවා නිසරු කතාවෙන් හා කම්මැලිකමට ගිනි තැපීමෙන් කාලය නැති කර ගෙන අලසව කල් යවා නිවන් මඟ වසාගත් බවත් දැක කුසීතව කම්මැලි වුවත් ජවය නැති, කොර නොවූ අශ්වයකු සේ පල නොලබා පරදින බව ද නොපමා වූ නැණවත් තැනැත්තා ජවසම්පන්න අශ්වයකු සේ අන්‍යයන් පසුකර මගඵල ලබා නිවන් අවබෝධ කරන බවත් වදාළ සේක.

මෙලොව පරලොව ජයගෙන දෙලොව දිනීමට උත්සාහයේ ඇති වැදගත්කම මේ කතා පුවතින් ද මැනවින් පැහැදිලි වෙයි.

**ගැටමාන්නේ සීවලී හිමි**



# කොග්ගල හබරාදුව ගුණදස්සී අරමට සෑ රදුන් වහන්සේ නමක් ඉදි වූ වගයි



**පොහොර ගබඩාව පන්සල, ජිනරතනාරාමය මෙන්ම වරෙක වැල්ලේ පන්සල යනාදී නේක නම්වලින් අප විහාරස්ථානය එකල ගම්වාසීන් අතර ප්‍රචලිත ය.**

ඓතිහාසික වශයෙන් වැදගත්කමක් ඇති ගුණදර්ශනාරාම ආරාමය දෙවැනි ලෝක යුද්ධය නිසා ද බලපෑමට ලක් වූ අතර, එකල ආණ්ඩුවේ නියෝග මත වැඩසිටි භික්ෂූන් වහන්සේලාට ද ඉවත්වන්නට සිදු විය. එහෙත් නැවතත් මෙම විහාරස්ථානය නගාසිටුවීමට මූලික අඩිතාලම සකසන ලද්දේ තලාතුඩුව ආරණ්‍ය සේනාසනාධිපති අපගේ ගුරු දේවෝත්තම දොරපේ ඉන්ද්‍රසෝභන මහ ස්ථවිරයාණෝ ය. මෙලෙස විවිධ බාධක කම්කටොලු මධ්‍යයේ ගොඩනැඟුණු අප විහාරස්ථාන භූමියට ස්වර්ණමය යුගයක් උදා වූයේ 2012 දී තෝමස් අමරසූරිය පිරිවෙනෙහි පරිවේණාධිපති ශාස්ත්‍රපති කුඹල්වෙල ඉන්ද්‍රසාර නාහිමියන් වැඩමවීමත් සමඟයි.

උන්වහන්සේගේ නොපසුබට උත්සාහයෙන් මෙන්ම කැපවීමෙන්, නේක වූ අනුශාසනා මධ්‍යයේ ගම්වාසීන්ගේ ද දායකත්වය මත අංග සම්පූර්ණ විහාරයක් බවට පරිවර්තනය කිරීම ආරම්භ විය. ඒ අනුව කාලයාගේ ඇවෑමෙන් ඉන්ද්‍රසාර හිමිගේ අනුදැනුම යටතේ, විහාර මන්දිරය, ධර්ම ශාලාව, සංඝාවාස ගොඩනැඟිල්ල, ෂණ්ඨාර කුලුන, මකර තොරණ, දේවාල මන්දිර සහ බෝධි ප්‍රාකාරය යනාදි සියලු අංග ජනතාවගේ වැඳුම් පිදුම් කටයුතු උදෙසා අභිනවයෙන් ඉදි විය.



**විහාරාධිකාරී ශාස්ත්‍රපති කුඹල්වෙල ඉන්ද්‍රසාර නාහිමි**

තවද ගම්වාසී දරුවන් වෙනුවෙන් දහම් අධ්‍යාපනය ලැබීම උදෙසා ගුණදර්ශනාරාම දහම් පාසලෙහි දොරටු නැවත විවර කරලීමට කැපවීමෙන් කටයුතු කරන්නේ ද අප නායක හිමිපාණන් වහන්සේ විසින්ම ය.

විහාරස්ථානයක පැවැතිය යුතුම අංගයක් ලෙස ශාරීරික, පාරිභෝගික හා උද්දේසික චෛත්‍යය හඳුන්වා දිය හැකිය. ඒ අනුව ගුණදස්සී අරමෙහි චිරස්ථිතිය තකා තවදුරටත් කටයුතු කරමින්, උද්දේසික චෛත්‍ය නිමැවීමේ උතුම් වූ ක්‍රියවලිය සඳහා ද ඉන්ද්‍රසාර  අප නාහිමිපාණෝ අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව කටයුතු කළහ. ඒ අනුව වර්ෂ 2013 වෙසක් මස 11 වැනිදා සෑරදුන් නිමවීමට මුල්ගල තබමින් එහි වැඩකටයුතුවල සමාරම්භක අවස්ථාව සනිටුහන් කරන ලදී.

විවිධ දායක, උපාසක උපාසිකා පින්වතුන්ගේ මූල්‍යමය දායකත්වයන් මත සෑරදුන්ගේ සියලු වැඩ නිමවා බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව සැදැහැවතුන්ගේ වන්දනීය පූජාවන්ට ඉඩ සලසා දෙමින් 2022 නොවැම්බර් මස විවෘත කරන ලදී.

අප විහාරස්ථානයේ ඉදිවූ සෑරදුන්ගේ සුවිශේෂත්වය වන්නේ ආසනයක් මත පිහිටුවා තිබීමයි. එය වටා ප්‍රදක්ෂිණා පථයක් ඇති අතර, නෙළුම් මල් ඔබ්බවා කැටයම් කළ ආරක්ෂක වළාකුලු බැම්මක් සහිත තාප්පයකින් වටවී තිබේ. එලෙසම සැදැහැවත් බෞද්ධ පින්වතුන්ගේ ශ්‍රද්ධාමය ප්‍රීතිය ජනිත කරවමින් චෛත්‍යය වටා ශිලාමය බුද්ධ ප්‍රතිමා  සතරක් සිව් දිශාවන්ට මුහුණලා මල් ආසන මත පිහිටුවා ඉදිකොට ඇත. එලෙසම සෑරදුන් ඇතුළත බුදු සසුනේ චිරස්ථිථිය උදෙසා කටයුතු කළ ආනන්ද මහරහතන් වහන්සේ, මුගලන් මහරහතන් වහන්සේ, බක්කුල ඇතුළු රහතන් වහන්සේ සය නමකගේ සිතුවම් නිරූපිතය.

අප විහාරස්ථානයේ ශාසන අභිවෘද්ධිය තකා දායක පින්වතුන් නොමදව බැඳෙමින් කටයුතු කරයි. ඒ බව තව තවත් පසක් කරලමින් මෙම වසරේ උතුම් වූ තෙමඟුල සිදුවූ වෙසක් පුර පසළොස්වක පෝදා රාහුල මාතා මහරහත් තෙරණියගේ ප්‍රතිමාව ද අභිනවයෙන් ඉදිකොට පූජා විය.

අප මහා බෝසතාණන් වහන්සේ පාරමී දම් පුරා සම්බුදු පදවිය ළඟා කරගනු වස් භවයෙන් භවය පෙරුම් පුරනා කල උතුම් පති දම් රකිමින් සසර පුරාවට පාදපරිචාරිකාව වී සිටි යශෝධරා මහරහත් තෙරණිය වන්දනා කර ගැනීමේ වාසනාව එසේ උදාවිය.

මෙලෙස ගුණදර්ශනාරාම විහාරස්ථානයේ ශාසනික උන්නතිය වෙනුවෙන් ම නිරන්තරයෙන් ඇප කැප වී සිටින අප නායක ස්වාමීන් වහන්සේහට දීර්ඝායුෂ ලැබේවා'යි ප්‍රාර්ථනා කරන අතර, ගම්වාසී සියලු උපාසක උපාසිකාවන් හටත් සෙත් ප්‍රාර්ථනා කරමු.



**අඟුණකොළපැලැස්සේ ධම්මින්ද හිමි**




## බුදු ගුණ රැව් දේ

බුදුගුණ පිරුණ හදවත තුළ කිලුට නැත
ඒ හද දැහැමි සිතිවිලිවල වෙළෙනු ඇත
මේ වෙනසට ම මුල කිමදැයි සිතෙනු ඇත
පින්වත දුටුවේ ද මුකුලිත වන දියත

සුදුවත දරන් උවසුන් එක පෙළක් සැදී
ගාට ගාටමින් ගොස් සෑ රදුට වඳී
හද සැනසේ ය නෙත් සිත් වෙනතකට නොදී
නේරංජනාවක් වැනි සිත නිසලව ම හිඳී

බුදු ගුණ රැව් දේය මද සුළඟට මුසුව
සුපහන් වදන් ම ය කා අතරෙත් කසුකුසුව
තෙමඟුල් දිනය උතුමන් කෙලෙසුන් නැසුව
සිහිපත් කරයි බෝපත් සුළඟට මුසුව

**ඩබ්.සංජීව විජේ සිරිවර්ධන**
ගලේවෙල

## මිනිසත් බවක් ලැබුමට

සසරේ කරන ලද පින් පව් අකට යුතු
අනුව ම සිදුවේ ය කෙනකුගෙ බවය මතු
බුදු බණ අනුව පැහැදිලි කළ යුතු ය තතු
මිනිසත් බවක් ලැබුමට පින තිබිය යුතු

**සී.බී. රත්නායක**



## විපාකය

නිමල සිතක උපදින සිතිවිලි නිර්මලය
එවන් සිතිවිලි අප හැර නොයනා සෙවනැල්ලක් බඳුය
අයහපත් චේතනා උපදින සිත පිළිකුල් ය
ඒ සිතිවිලි දෙන විපාකය ගොනු පසු පස යන ගැල මෙන් ය


පාණදුර
**අරුක්ගොඩ ඩබ්.පී. ඉන්ද්‍රානි**

## අමා නිවන් ලැබුමට

මේ කය පෙණ පිඬ මිරිඟුව වැන්නේ
සිතන තැනැත්තා කෙලෙස් සිඳින්නේ
බන්ධන මල් දම් සිඳ බිඳ ලන්නේ
අමා නිවන් මඟ පසක් කරන්නේ

**මිරිජ්ජවිල සිරි දන්තනාරායන**

## අලුත් සඳක් පෑයුවා - මහමෙව්නා උයනේ



අලුත් සඳක් පෑයුවා මහමෙව්නා උයනේ
සඳ හිරු සේ පවතීවා පින් ඇති ලක් දෙරණේ
විරු දන ජන රැකදේවා සෙත සලසා පෙමිනේ
මලින් ගඳින් පුද දේවා සඳ හිරු සෑ රජුනේ

සඳ හිරු සම්දුන් සෙවණේ
සුදු වැලි ඇතිරූ මළුවේ
දෙදණ නමා වැඳ වැටුණේ
පතමින් හිමි සඳු සරණේ

මහ දාගැබ් සිප හමනා
සුළඟේ දැවටී ඇදෙනා
රට රැක සුර විරු සුවඳයි
වැලිතල මළුවේ දැනෙනා

සුවහස් දන මන සනහා
දිවිදුන් විරු දන පිදෙනා
සඳ හිරු සෑ රජු පුදනා
වන මල් විලසින් පිදෙනා

**ඒ.එම්.පී.බී. අදිකාරී**
කුලියාපිටිය

## සයුර හා සසර

ඈත රළ පෙළ
බිඳෙන හෝ හඬ
වසා නෙතු පියන්
නොසෙල් වී වෙරළ වැලි තල මත
නතර වී සක්මන
මදක් යොමු කොට සවන
එක් තැන් කොට
විසිරුණු දහසකුත් සිතිවිලි
අත් හළෙමි එකින් එක
නැත මගේ කිව හැකි කිසිත්
දැනුණි සුවයක් සදාකාලික
සයුර වන් කෙලෙස් පහව යන බව දැන

**හඳා ශ්‍යාමලී**



## බුදු හිමි දැක්කෙමි

අමාමෑණී බුදු හිමියනි
ඔබ දෙසූ දම් කඳින්
අබැටක් සා පමණ
දැන ගත්තෙමි
දැක ගත්තෙමි
ඉවසීමෙන් විමසීමෙන්
ශ්‍රද්ධාවෙන් බුද්ධියෙන්
එළඹ සිටි සිහියෙන්

තාවකාලිකයි අස්ථිරයි
සියලු දේ මෙදියත
වෙනස් වෙයි අසුරු සැණක් පාසා
අල්ලා බදා නොගනිමි
ලොවේ කිසිවෙක් කිසිවක්

**ජේ.පී. රණතුංග**

## ජීවිතය ...

චුති චිත්තය
ඉවත්ව ගොස්
ප්‍රතිසන්ධිය ලබා
අලුත් කලලයක

නැවත පටන්ගත් ජීවිතය
ඒ මම ද?
නැත
මම නොවෙමි ද?
නැත
නවසෝ නව අඤ්ඤෝ
සමිඳු දෙසූ වග
ඇසුනි දෙසවනට
දම් දෙසුමක දී
කුමක්ද?
මේ ජීවිතය...
සොයා යමු

විශ්‍රාමික ගුරු
**කේ.ජී.ඒ. අබේරත්න**
පහළ දුල්වල



## සම්බුදු තෙමඟුල



ඉපදී බුදුව පිරිනිවනට වැඩි වෙසගේ
බොදු දන යා යුතු ය හිමි දෙසු මඟ සුමගේ
දූ දරුවනේ නොයනු මැනවි නොමගේ
බලනු මැනවි සෑසි රජු වැඩිය රගේ

සම්බුදු සසුන තව දිගුකල් වැජඹේවා
ගෞතම සමිඳු අප හට මිණි පහනක් වේවා
නිර්මල දහම ලොව දස අත පැතිරේවා
නිවන් දකින තුරු අප සුගතියෙ ඉපදේවා

තිලොවට තිලක සිරි සම්බුදු තථාගත
අපහට දෙසා ඇත අමා මහ නිවන් මඟ
ලුම්බිණියේ උපන් සුදොවුන් මහමායා පුත
සසරේ දියුණු කර දම් දෙසුවා ය සිත

**අජිත් වික්‍රමනන්ද වීරසූරිය**
මොරගොල්ල
ඉඹුල්ගස්දෙණිය

## බුදුගුණ

කෙලෙස් බරින් තෙරපී බව කතරෙ ගැලී
මිනිසා දුවන විට ආශාවෙහි ම වෙළී
නවතිනු කියා සතහට දුන්න සැනසිලී
දසබල පියේ ඔබ හට මහද ගඳ කිළී

ඉපදී රජ ගෙයක සම්පත් පිරුණු සැම
ඒ යස ඉසුරු කොට පාදූලියට සම
දුක් විඳ සොයා ගිය මෙ බව කතරෙ නිම
හිමියනි ඔබේ සිරිපා යුග වඳිමි මම

යටිටාවල
**ගාමිණී චන්ද්‍රසේන**

## පැහැදීම

බින්තැන්නේ වැව් සිසිලස ලබා වෙහෙස නිවාගන්නේ
සමන් සුරිඳුගේ පිහිට පතාලා වරම් ලබා ගන්නේ
මියුගුණ සෑයේ සෙවණේ ඉඳලා නෙත් සනසා ගන්නේ
බුදුබණ අසලා මහ බෝ වැඳලා සිත් පහදා ගන්නේ

**ගාමිණී ජයලත් තල්දෙන**

# කුරුන්දි පරිසංවාදය හා දකුණු ඉන්දියාවේ ථේරවාදී බුදු දහමේ ව්‍යාප්තිය දෙමළ පරිවර්තනය එළිදැක්වීම 19 ද




කුරුන්දි පරිසංවාදය හා දකුණු ඉන්දියාවේ ථේරවාදී බුදු දහමේ ව්‍යාප්තිය දෙමළ පරිවර්තනය එළිදැක්වීම පිළිබඳ මාධ්‍ය හමුවක් පසුගියදා බෞද්ධ මහා සම්මේලනයේ දී පැවැති අතර, එහිදී බෞද්ධාලෝක පදනමේ සභාපති ජගත් සුමතිපාල මහතා විසින් දකුණු ඉන්දියාවේ ථේරවාදී බුදු දහමේ ව්‍යාප්තිය දෙමළ පරිවර්තනය ගැන අදහස් දැක්වූ අයුරු.

සේයාරුව – දුෂ්මන්ත මායාදුන්න

මුලතිව් දිස්ත්‍රික්කයේ කුරුන්දි බෞද්ධ උරුමය ගැන පරිසංවාදයක් 19 වෙනිදා පෙරවරු 9.00ට මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර උසස් අධ්‍යාපනය ආයතනයේ දී සිදු කෙරේ. කුරුන්දි යනු ඝධාකාර සම්ප්‍රදායේ මෙරට හමු වී ඇති එකම දාගැබ වන අතර, එය සංරක්ෂණය කිරීමේ දායකත්වය බෞද්ධාලෝක පදනම විසින් සිදු කරනු ලැබේ.

එමෙන්ම එහිදී, එදිනම පස්වරු 2.00ට ආචාර්ය හිඳගල ඥාණාධාර ස්වාමීන් වහන්සේ විසින් රචිත දකුණු ඉන්දියාවේ (ද්‍රවිඩ දේශයේ) ථේරවාදී බුදු දහමේ ව්‍යාප්තිය ග්‍රන්ථයේ දෙමළ භාෂාවට පරිවර්තනය එළිදැක්වීම ද සිදු කෙරේ.

සාහිත්‍ය බහුමානයන්ට පාත්‍රවූ එම ග්‍රන්ථය දෙමළ භාෂාවට පරිවර්තනය කරනු ලැබුවේ මුත්තයියා දොරේසාමි සහ රාමයියා සඳගෝපන් යන මහත්වරුන් විසිනි. ග්‍රන්ථය ප්‍රකාශයට පත් කර ඇත්තේ බෞද්ධාලෝක පදනම විසිනි. මෙම එළිදැක්වීමේ මුලසුන මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර විසින් හොබවන අතර, දකුණු ඉන්දීය ශාසන ඉතිහාසය ගැන දෙසුමක් රාජකීය පණ්ඩිත වජිර ප්‍රභාත් විජේසිංහ විසින් ද දකුණු ඉන්දීය බුදු දහමේ පරිහානිය ගැන මහාචාර්ය ජයපාල් හා දකුණු ඉන්දීය බුදුදහමේ පුනර්ජීවනය ගැන ගෞතම් ප්‍රභූ නාගප්පන් විසින් ද දෙසුම් පවත්වති.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය 22 වැනි වරටත් සංවිධානය කළ බෞද්ධාලෝක වෙසක් උත්සවයේ දෙවැනි දින ධාතු ප්‍රදර්ශනය විවෘත කිරීම ශ්‍රී ලංකාවේ මියන්මාර තානාපතිතුමන් අතින් සිදු කෙරුණි. මේ අවස්ථාවට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා ඇතුළු කෘත්‍යාධිකාරි මණ්ඩල සාමාජික භවතුන් ද සහභාගි වූහ.





මොනරාගල දිස්ත්‍රික්කයේ පිරිවෙන්වල ඉගෙනුම ලබන 2023 මූලික පිරිවෙන් අවසාන විභාගයට ඉදිරිපත්වන ගිහි පැවිදි ශිෂ්‍යයින් හතළිස් හතර දෙනකුට ගමන් වියදම් සහ මූල්‍යාධාර පිරිනැමීම පසුගිය ද කතරගම වැඩසිටිකන්ද පුදබිමේ දී සිදු කෙරිණි.
අමරපුර නිකායේ ඌව වෙල්ලස්ස දෙදිසාවේ ප්‍රධාන සංඝනායක සෙල්ලකතරගම ධර්ම නිකේතන මහා පිරිවෙන්පති හීල්ලේ ඥාණානන්ද නාහිමියන්ගේ මූල්‍ය ආධාර පිරිනැමීම මෙහිදී සිදු කෙරිණි.

# මාවිත්තර සිරි තිසරණ ධර්මායතනයේ ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවය











පිළියන්දල, මාවිත්තර සිරි තිසරණ ධර්මායතනයේ සිරි සරණපාල ධර්ම විද්‍යාලයීය දූ දරුවන් වෙත "කීර්ති සමරසිංහ දිසානායක අනුස්මරණ ත්‍යාග සහ සහතික පත්‍ර ප්‍රදානය, ශිෂ්‍ය නායක නිල ලාංජන පැළඳවීමේ උත්සවය පසුගිය 09 වැනි ද එම විහාරස්ථානයේ දී උත්කර්ෂවත් අයුරින් සිදු කෙරිණි. එහිදී ආරාධිත අමුත්තන් අතින්, දූ දරුවන් නිළ ලාංජන, ත්‍යාග සහ සහතික පත් ලබා ගත් බව විහාරාධිපති ඇඹිලිපිටියේ රතනජෝති හිමියෝ දන්වා සිටිති. එම අවස්ථා ඡායාරූපවල දැක්වේ.